RESPECT

WOMEN

# RESPECT රාමුව
# අධීක්ෂණය සහ ඇගයීම මාර්ගෝපදේශ

UN WOMEN

World Health Organization

# හැඳින්වීම

අධීක්ෂණය සහ ඇගයීම සම්බන්ධ මාර්ගෝපදේශය විසින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් අධීක්ෂණය හා ඇගයීම සඳහා මූලෝපායන් සඳහා වැදගත් මාර්ගෝපදේශ ඉදිරිපත් කරයි. මාර්ගෝපදේශයෙහි අරමුණ වන්නේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා අධීක්ෂණ හා ඇගයීම් රාමුවක් සංවර්ධනය කරන හා ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ සපයන RESPECT රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීමයි. එමගින් RESPECT මූලෝපායන් හත සඳහාම වෙන වෙනම අධීක්ෂණ හා ඇගයීම් දර්ශක සපයයි. ආරක්ෂාකාරී හා ආචාරධාර්මික අධීක්ෂණ හා ඇගයීම් පද්ධතියක් හා ක්‍රියාවලියක් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ උපදෙස් සපයයි. එය පරිසමාප්ත නැත. එය RESPECT මූලෝපාය ලේඛන සමග භාවිතා කිරීම සඳහා යෝග්‍ය සාරාංශයක් ලෙස සැලකීම වඩා සුදුසුය. එය ප්‍රායෝජනවත් සම්පත් සමග අවශ්‍ය පරිදි වැඩිදුරටත් සම්බන්ධ වේ.

## කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම් කටයුතු අධීක්ෂණය හා ඇගයීම වැදගත් ඇයි?[1]

**කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී හා ප්‍රතිචාර දැක්වීමේදී සාර්ථක වන්නේ කුමක්ද යන්න පිළිබඳ ප්‍රබල ගෝලීය සාක්ෂි නිර්මාණය කිරීම:** සාක්ෂි ගොනුව වර්ධනය වෙමින් තිබෙනමුත්, වැඩියෙන්ම සාර්ථක වන්නේ කුමන මූලෝපායන් හා මැදිහත්වීම්ද, ඒ කුමන සංදර්භය තුළද, කුමන ජනගහන කණ්ඩායමට ද, ඒ මක් නිසාද යන්න තේරුම්ගැනීම සම්බන්ධයෙන් තවදුරටත් අඩුපාඩු තිබේ. සමීප සහකරුගේ ප්‍රචණ්ඩත්වය සහ සහකරු නොවන පුද්ගලයන්ගේ ලිංගික හිංසනය වැනි කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ ඇතැම් ස්වරූප සඳහා සාක්ෂි ප්‍රමාණවත්ය. එහෙත්, වෙනත් ස්වරූපයන් සම්බන්ධයෙන් සීමිතය.

**වැඩසටහන් සාර්ථකත්වය හා ඵලදායීතාව අධ්‍යයනය කිරීම සඳහා:** වැඩසටහනක් මගින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත හැකි පරිදි එම වැඩසටහන නිසි මාර්ගයේ ගමන් කරන්නේද, නැතිනම්, හැඩගැස්වීම් අවශ්‍යද යන්න අධීක්ෂණ හා ඇගයීම් ක්‍රියාවලිය ඔස්සේ හඳුනාගත හැකිය. එමගින් මැදිහත්වීමක සාර්ථකත්වය තක්සේරු කළ හැකිය. මැදිහත්වීම් ඵලදායීදැයි සහ ඒ කවුරුන් සම්බන්ධයෙන් කුමක් නිසාදැයි හඳුනාගත හැකිය.

**අවශ්‍ය ප්‍රමාණයෙන් ක්‍රියාත්මක කළ හැකි වඩාත්ම ඵලදායී හා කාර්යක්ෂම ක්‍රම හඳුනාගැනීම:** ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේලා සාර්ථක වන්නේ කුමක්ද යන කරුණ පිළිබඳ සාක්ෂි ගොනුව වර්ධනය වෙමින් තිබෙනමුත්, මැදිහත්වීමේ බලපෑම අවම කරනොගෙන ප්‍රචණ්ඩත්වය අවශ්‍ය ප්‍රමාණයෙන් වඩාත්ම ඵලදායී ලෙස වළක්වාගන්නේ කෙසේද යන්න පිළිබඳ තිබෙන්නේ අඩු දැනුමකි.

**වැඩසටහනට හා ප්‍රතිලාභීන් හට බලපෑ හැකි අවදානම් හඳුනාගැනීම සහ කළමනාකරණය කිරීම:** කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් මගින් ඉලක්ක කරනු ලබන්නේ සමාජභාවී හා බල අසමානතා වෙනස් කිරීමයි. එමනිසා එම වැඩසටහන් හේතුවෙන් ප්‍රජාවේ සාමාජිකයන්, පිරිමින් සහ බලය හොබවන්නන් වෙතින් ප්‍රතිරෝධය, චර්යාවන් පාලනය කිරීම සහ/හෝ වැඩිදුර ප්‍රචණ්ඩත්වය වැනි ඍණාත්මක ප්‍රතිචාර ඇතිවිය හැකිය. මෙම අවදානම් හඳුනාගැනීමට හා ඒවා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අධීක්ෂණ හා ඇගයීම් පද්ධති වැදගත් වේ.

**කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ගෝලීය මට්ටමින් වැළැක්වීමේ ප්‍රගතිය ස්ථාවර අන්දමින් හඳුනාගැනීම හා මැනීම තහවුරු කිරීම:** කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කටයුතුවල ප්‍රගතිය මැනීම සමග සම්බන්ධ ප්‍රධාන අභියෝගයක් වන්නේ දර්ශකවල සහ මිනුම්වල අධික පුළුල්කමයි. ඒ හේතුවෙන් ලැබෙන දත්ත සන්සන්දනය කළ නොහැකි වේ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ ඇතැම් වර්ග සම්බන්ධයෙන් ප්‍රතිඵල මට්ටමේ දර්ශක සහ මිනුම් වඩා විධිමත් කරනු ලබමින් තිබේ. වෙනත් වර්ගවල ප්‍රචණ්ඩත්වය සහ සමාජ සම්මතයන්ගේ වෙනස්කම් වැනි ප්‍රතිඵල සම්බන්ධ දර්ශකවල විශාල විවිධත්වයක් තිබේ. බලපෑම සහ ප්‍රතිඵල යන කාරණා දෙකම වෙනුවෙන් සන්සන්දනය කළ හැකි ගෝලීය දර්ශක කට්ටලයක් සංවර්ධනය කිරීම වැදගත්ය.

### 1 කොටුව: අර්ථ නිරූපණ

අධීක්ෂණය: යනු, අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීමට අදාළව සහ කළමනාකරණ තීරණවලට මගපෙන්වීම සඳහා වැඩසටහනක ප්‍රගතිය සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීමේ, විශ්ලේෂණය කිරීමේ හා භාවිතා කිරීමේ ක්‍රියාවලියයි. අධීක්ෂණය විසින් සාමාන්‍යයෙන් ක්‍රියාකාරකම් සිදුකරන්නේ කවදාද, කොහිදීද, කවුරුන් විසින්ද, ඒවා පුද්ගලයන් හා ආයතන කීදෙනෙකු වෙත සමීප වෙනවාද යනාදී ක්‍රියාවලි කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ.

ඇගයීම: යනු, ක්‍රියාකාරකමක්, ව්‍යාපෘතියක්, වැඩසටහනක්, මූලෝපායක්, ප්‍රතිපත්තියක්, මාතෘකාවක්, තේමාවක්, අංශයක්, මෙහෙයුම් කලාපයක් හෝ ආයතනික කාර්යසාධනයක් විධිමත් අන්දමින් තක්සේරු කිරීමයි. අපේක්ෂිත හා සාක්ෂාත් කරගන්නා ලද සාර්ථකත්වයන් කෙරෙහි ඇගයීමෙහි අවධානය යොමුවේ. ප්‍රතිඵල දාමය (යෙදවුම්, ක්‍රියාකාරකම්, ප්‍රතිඵල, ප්‍රතිදාන සහ බලපෑම්), ක්‍රියාවලි, සංදර්භීය සාධක සහ අවදානම් කෙරෙහි ඇගයීමෙහි අවධානය යොමුවේ. එහි අරමුණ වන්නේ සාර්ථකත්වය හෝ අඩු සාර්ථකත්වය අවබෝධ කරගැනීමයි.

මූලාශ්‍රය: Programming Essentials, Monitoring & Evaluation. UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls

## කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන්වල අධීක්ෂණය හා ඇගයීම සඳහා මූලධර්ම

අධීක්ෂණය හා ඇගයීම සැලසුම් කිරීමේ ව්‍යුහයන්හිදී **දේශීය පාර්ශ්වකරුවන් සහ හවුල්කරුවන් ඇතුළත් කරගන්න**. ඒවා සංදර්භයට ගැලපෙන තත්වයට පත්කරගැනීමට හා සාක්ෂි අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා යෝග්‍ය වේ.

**අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධ ප්‍රවේශයන් බේරුණු පුද්ගලයන් කේන්ද්‍රීය බව තහවුරු කරන්න**. මෙහි අරුත නම් එමගින් එයට සහභාගී වන කාන්තාවන්ගේ පෞද්ගලිකත්වය, රහස්‍යභාවය සහ ශාරීරික සහ භාවමය සුරක්ෂිතභාවය ආරක්ෂා වන බවයි.

**සමාජභාවයට ප්‍රතිචාරාත්මක ප්‍රවේශයක් අනුගමනය කරන්න:** සමාජභාවය සහ බල සම්බන්ධතා පිළිබඳ විශ්ලේෂණයක් අධීක්ෂණය හා ඇගයීමට ඇතුළත් විය යුතුය. සැමදෙනා ඇතුළත් කරගන්නා සවිබලගැන්වීමේ ක්‍රමයක් භාවිතා කළ යුතුය.

අරමුදල් සපයන්නන්ට හා වැඩසටහනට සහභාගී වන්නන්ට **ඉගෙනුම හා වගවීම යන කාරණා දෙකම තහවුරු කරන්න**. මේ සඳහා වැඩසටහන් සැලසුම් කිරීමට, හැඩගස්වාගැනීමට, තීරණ ගැනීමට, වැඩසටහන් තක්සේරු කිරීමට සහ පාඩම් ඉගෙනීමට ප්‍රයෝජනවත් දත්ත එක්රැස් කිරීම අවශ්‍ය වේ. සහභාගී වූවන් සහ සම්බන්ධ වූ ප්‍රජාවන් සමග ප්‍රතිඵල බෙදාගැනීමේ හා ප්‍රතිපෝෂණය ලබාගැනීමේ යාන්ත්‍රණයන් තිබිය යුතුය.

**සක්‍රිය සහභාගීත්වය තහවුරු කරන ක්‍රම සහ මෙවලම් භාවිතා කරන්න:** ක්‍රම සහ මෙවලම් මගින් සක්‍රිය සහභාගීත්වය උපරිම කළ යුතුය. ඒවා දේශීය සංදර්භයට ගැලපිය යුතුය. සමාජ සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන සංදර්භයට, භාෂාවට හා සාක්ෂරතා මට්ටමට සහ සහභාගිකයන්ගේ ඕනෑම ආබාධිත මට්ටමකට අවධානය යොමුකිරීම ද එයට ඇතුළත් විය යුතුය. ඉහළ ගුණාත්මකභාවයකින් යුක්ත සහ යෝග්‍ය අධීක්ෂණය හා ඇගයීම් ප්‍රවේශයන් වැඩසටහන් සැලසුම් තුළට ආරම්භයේ සිටම ඇතුළත් කරගත හැකිවන පරිදි **ප්‍රමාණවත් අයවැය තහවුරු කරන්න**.

## කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා අධීක්ෂණය හා ඇගයීම රාමුවක් සංවර්ධනය කිරීම

අධීක්ෂණ හා ඇගයීම් රාමුවක් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගත යුතු වැදගත් පියවර රාශියක් තිබේ. එය ශක්තිමත් අධීක්ෂණ හා ඇගයීම් ක්‍රමයක පදනමයි. මෙම පියවර සම්පාදනය කර තිබෙන්නේ විවිධ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ හා අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධ සම්පත් ඇසුරෙනි. වැඩිදුර මගපෙන්වීම් ඒ ඔස්සේ ලබාගත හැකිය.[2]

1. **සංවර්ධනාත්මක සමීක්ෂණ (Formative Research) / තත්ව විශ්ලේෂණ**

ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ මැදිහත්වීම් සංවර්ධනය කිරීමට පෙර හා සංවර්ධනය කරන අතරතුර සංවර්ධනාත්මක සමීක්ෂණ මෙහෙයවීම වැදගත් වනු ඇත. ඇතැම්විට ඒවා තත්ව විශ්ලේෂණයන් ලෙස හැඳින්වේ. එමගින් වැඩසටහන් සැලසුම් කිරීම හා හැඩගස්වාගැනීම සඳහා තොරතුරු ලබාදිය හැකිය. සංවර්ධනාත්මක සමීක්ෂණ මගින් පහත දැක්වෙන වැඩසටහන් ක්‍රියාත්මක වන විශේෂිත සංදර්භයන් පරීක්ෂා කරනු ලැබේ:

- ප්‍රචණ්ඩත්වය පැවැත්මේ හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ විශේෂිත ධාවකයන්ගේ වර්ග හා මට්ටම් - මෙම ධාවකයන් සම්බන්ධ මූලික දැක්ම ද ඇතුළත්ව
- විවිධ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ ස්වරූප නිර්මාණය කරන හා ඒවා තහවුරු කරන විශේෂිත විශ්වාසයන් හා සමාජ සම්මතයන්
- අවදානම් සහිත කණ්ඩායම් ඇතුළු විවිධ ජන කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතා සහ අත්දැකීම්
- දැනට පවතින මැදිහත්වීම්, උගත් පාඩම් සහ ඒවායේ බලපෑම් සම්බන්ධ සාක්ෂි
- බේරුණු පුද්ගලයන් සඳහා සහායක සේවා, ඒවා වෙත ප්‍රවේශය සහ ධාරිතාව
- විධිමත් සහ අවිධිමත් ක්‍රියාකරුවන් ඇතුළත් ප්‍රධාන පාර්ශ්වකරුවන්, ඔවුන්ගේ ධාරිතාවන්, දැනුම, ආකල්ප සහ භාවිතාවන්

මේ සමග ඇති වැඩපොතෙහි පළමු පියවර ජාතික වැළැක්වීමේ මූලෝපායක් සැකසීම සම්බන්ධයෙන් වන අතර ජාතික/ උප ජාතික මට්ටමේදී තත්ව විශ්ලේෂණයක් සිදුකරන ආකාරය පිළිබඳ වඩා සවිස්තර මාර්ගෝපදේශයක් එහි අඩංගු වේ.

2. **වෙනස වෙනුවෙන් න්‍යායක් සංවර්ධනය කිරීම**

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය රාමුවක් සංවර්ධනය කිරීමේ වැදගත් පියවරක් වන්නේ වැඩසටහන සඳහා වෙනස් කිරීමේ න්‍යායක් (ToC) සැලසුම් කිරීමයි. එමගින් පහත දැක්වෙන සිතියම්ගත කිරීම සිදුකළ යුතුය:

- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ දැනුමේ, ආකල්පවල සහ චර්යාවන්ගේ වෙනස්කම හෝ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අවධානම් සාධකවල අපේක්ෂිත ගමන් මාර්ග
- එම ගමන් මාර්ග අපේක්ෂිත ප්‍රතිඵලය වෙත යොමුවන්නේ කෙසේද යන්න
- වෙනසට නායකත්වය දෙනු ඇතැයි අපේක්ෂිත ගමන් මාර්ග සහ ක්‍රියාවලි විස්තර කරන උපකල්පන

වෙනත් අධීක්ෂණය හා ඇගයීම රාමු සඳහා ප්‍රතිඵල රාමු සහ තාර්කික රාමු අයත් වේ. එමගින් සාමාන්‍යයෙන් වැඩසටහනකින් අපේක්ෂිත යෙදවුම්, ක්‍රියාකාරකම්, ප්‍රතිදාන, ප්‍රතිඵල සහ බලපෑම් වඩා රේඛීය අන්දමින් සිතියම්ගත කරනු ලැබේ. රේඛීය අධීක්ෂණ හා ඇගයීම් රාමු සාමාන්‍යයෙන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන්වලදී ප්‍රමාණවත් වන්නේ නැත. එයට හේතුව එමගින් වෙනස සඳහා වන විවිධ ගමන් මාර්ගවල සංකීර්ණතා සහ සබඳතා සිතියම්ගත නොකරන බැවිනි. සෑම RESPECT මූලෝපාය සාරාංශයක් විසින්ම සරල වෙනස් කිරීමේ න්‍යායක් සපයනු ලැබේ. වැඩසටහන් සාරාංශවල නිශ්චිත වැඩසටහන් උදාහරණ සඳහා වෙනස් කිරීමේ න්‍යාය ඉදිරිපත් කර තිබේ.

### 3. අධීක්ෂණ හා ඇගයීම් ප්‍රශ්න සැලසුම් කිරීම

අධීක්ෂණය හා ඇගයීම ප්‍රශ්න කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහනේ සමස්ත අරමුණ මත පදනම් විය යුතුය. එය මනා ඇගයුම් සැලැස්මක පදනමයි. අපේක්ෂිත ආසන්න හා දිගුකාලීන ප්‍රතිඵල සාක්ෂාත් කරගත්තාද (සිදුවන්නේ කුමන වෙනස්කම්ද) යන ප්‍රශ්නය ඇසීමට අමතරව, වෙනස්කම් සිදුනොවන්නේ ඇයිද යන්නද ප්‍රශ්න මගින් අධ්‍යයනය කළ යුතුය. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පාඩම්, සාර්ථකත්වයන් හා අභියෝග අධ්‍යයනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රොටොකෝල අනුගමනය කෙරේද යන්න පිළිබඳ ප්‍රශ්න ද අඩංගු විය යුතුය. මෙය බොහෝ විට බලපෑම් ඇගයීමකට වඩා ක්‍රියාවලි ඇගයීමක් ලෙස සැලකේ.

වෙනස් කිරීමේ න්‍යායෙන් ඔබ්බට විහිදෙන ප්‍රශ්න ඇසීම සහ වැඩසටහනේ අනපේක්ෂිත සාධනීය හා නිශේධනීය ප්‍රතිඵල තිබේද යන්න විමසීමේ ප්‍රශ්න ඇසීම වැදගත්ය. අවදානම කළමනාකරණය කිරීමේ මූලෝපායන් සාර්ථකද යන්න අධ්‍යයනය කළ යුතුය. අවසාන වශයෙන්, OECD DAC ඇගයුම් නිර්ණායක අනුව (ඒවා 2 කොටුවෙහි දැක්වේ) එයින් ප්‍රතිලාභ ලබාදීමට අපේක්ෂිත සහභාගිකයන්ට වැඩසටහනේ අදාළත්වය පිළිබඳ ප්‍රශ්න ඇසීම ද ප්‍රයෝජනවත්ය. සාධනීය බලපෑමක් නිරීක්ෂණය කර තිබේ නම්, වැඩසටහනේ කාලරාමුවට ඔබ්බෙන් මැදිහත්වීමේ ප්‍රතිලාභ තිරසර කරගත හැක්කේ කෙසේද යන්නද විමසිය හැකිය.

### 4. ඇගයුම් ප්‍රවේශය සැලසුම් කිරීම

වැඩසටහනක ප්‍රතිඵල හා බලපෑම මැනීම හා පැහැදිලි කිරීම සඳහා භාවිතා කරනු ලබන ඇගයුම් සැලසුම් ප්‍රධාන වශයෙන් වර්ග තුනකි.

1. **පර්යේෂණාත්මක සැලසුම:** මෙම සැලැස්ම බොහෝවිට අහඹු ලෙස කරනු ලබන පාලන අත්හදාබැලීමක් (RCT) ලෙස හැඳින්වේ. එහිදී පුද්ගලයන් හෝ සමූහයන් (උදා: ප්‍රජාවන් හෝ පාසල්) මැදිහත්වීමක් ලබාගැනීම සඳහා අහඹු ලෙස යොදවනු ලැබේ (ප්‍රතිකාර හෝ මැදිහත්වීම සිදුවන කණ්ඩායම). අනෙක් කණ්ඩායම (පාලන කණ්ඩායම) එසේ නොවේ. මෙම ඇගයුම් සැලැස්ම ඉතා දැඩි එකක් ලෙස සැලකේ. එය මැදිහත්වීම සහිතව හා රහිතව තත්වයන් සෘජුවම සන්සන්දනය කරයි. ඒ අනුව, මැදිහත්වීම්වලට වෙනස්කම් ආරෝපණය කිරීම ද කළ හැකිය. එය ඉතා අනම්‍ය වන අතර මිල අධික විය හැකිය. ඇගයීම්වලදී වැඩසටහනෙන් සෘජුව ප්‍රතිලාභ නොලබන කාන්තාවන් අහඹු ලෙස පාලක කණ්ඩායම්වලට සම්බන්ධ කිරීම කෙතරම් ආචාරධාර්මිකද යන ගැටලුව සම්බන්ධයෙන් විවාද තිබේ. එම නිසා, යහපත් භාවිතාව වන්නේ, බලපෑම සම්බන්ධයෙන් කරන ලද ඇගයීම් මගින් සාධනීය ප්‍රතිඵල ලැබී තිබේ නම්, පාලක කණ්ඩායම්වල මැදිහත්වීම සිදුකරන ආකාරය ඇගයීම අවසන් වීමෙන් පසු සැලසුම් කිරීමයි.

**2 කොටුව: ඇගයීම සඳහා නිර්ණායක**

අදාළත්වය: ආධාර ක්‍රියාකාරකම ඉලක්ක කණ්ඩායමේ, ප්‍රතිලාභීන්ගේ හා ආධාරකරුවන්ගේ ප්‍රමුඛතා සහ ප්‍රතිපත්තිවලට ගැලපෙන තරම.

ඵලදායීතාව: ආධාර ක්‍රියාකාරකම විසින් එහි අභිමතාර්ථය සාක්ෂාත් කරගන්නා ප්‍රමාණය පිළිබඳ මිනුමක්.

කාර්යක්ෂමතාව: ආදානවලට සාපේක්ෂව ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් තිබෙන ප්‍රතිදාන මනියි. කැමති ප්‍රතිඵලය ලබාගැනීම සඳහා අඩුම වියදම් ක්‍රමය එයද?

බලපෑම: සංවර්ධන මැදිහත්වීමක් මගින් නිර්මාණය කරනු ලබන සෘජු හා වක්‍ර, අපේක්ෂිත හා අනපේක්ෂිත, සාධනීය හා නිශේධනීය වෙනස්කම්.

තිරසරභාවය: ආධාරකරුවන්ගේ ආධාර ඉවත් කරගත් පසුව පවා ක්‍රියාකාරකමක ප්‍රතිලාභ තවදුරටත් පවතින්නේදැයි මැනීම.

මූලාශ්‍රය: OECD (2010) Glossary of Key Terms in Evaluation and Results-Based Management

2. **අර්ධ පර්යේෂණාත්මක සැලසුම - සන්සන්දනාත්මක කණ්ඩායමත් සමග:** මෙම සැලැස්ම පර්යේෂණාත්මක සැලැස්මකට සමාන වේ. එහිදී එක් කණ්ඩායමක් වෙත මැදිහත්වීම සිදුවේ (ප්‍රතිකාර හෝ මැදිහත්වීම් කණ්ඩායම). තවත් කණ්ඩායමකට එය නොලැබේ (සන්සන්දනාත්මක කණ්ඩායම). කෙසේ වෙතත්, එක් කණ්ඩායමකට හෝ තවෙකෙකට අහඹු පැවරීම් නැත. එමගින් සාම්පලයට බලපෑමක් ඇතිවීමේ හැකියාව තිබීම එයට හේතුවයි. කෙසේ වෙතත්, සන්සන්දනාත්මක කණ්ඩායම තෝරාගනු ලබන්නේ මැදිහත්වීම් කණ්ඩායමට හැකි තරම් සමීප 'සන්සන්දනයක්' සිදුකිරීමේ අරමුණ වෙනුවෙන් අදාළ නිර්ණායක අනුව නම්, මෙම සැලැස්ම බැරෑරුම් එකක් විය හැකිය.බොහෝ දුරට අහඹු ලෙස කරනු ලබන පාලන අත්හදාබැලීම්වල පරිද්දෙන්, සන්සන්දනාත්මක කණ්ඩායම් සහිත අර්ධ පර්යේෂණාත්මක සැලසුම් ද වියදම් අධික විය හැකිය. ඇතැම්විට එහි වියදම අහඹු ලෙස කරනු ලබන පාලන අත්හදාබැලීම්වලට වඩා වැඩි විය හැකිය. එයට හේතුව, අහඹු ලෙස සිදු නොවන බව තහවුරු කරගැනීම සඳහා විශාල සාම්පල භාවිතා කිරීමට සිදුවීමයි. සන්සන්දනාත්මක කණ්ඩායම් සහිත අර්ධ පර්යේෂණාත්මක සැලසුම් හේතුවෙන් ආචාරධාර්මික ප්‍රශ්න ද ඇතිවිය හැකිය. එම ප්‍රශ්න පර්යේෂණාත්මක ක්‍රම සම්බන්ධයෙන් පෙන්වාදෙන ලද ප්‍රශ්නවලට සමානය.

3. **පර්යේෂණාත්මක නොවන සැලැසුම:** මේවා වනාහි පාලක හෝ සන්සන්දනාත්මක කණ්ඩායමක් භාවිතා නොකරන ඇගයුම් සැලසුම්ය. පර්යේෂණාත්මක නොවන සැලසුම්වලදී සාමාන්‍යයෙන් පූර්ව හා පශ්චාත් පරීක්ෂණ ප්‍රවේශයක් අනුගමනය කරනු ලැබේ. එහිදී ප්‍රතිඵල මනිනු ලබන්නේ මැදිහත්වීමක් ලබාගන්නා ජනගහනයේ කාල ලක්ෂ්‍ය දෙකක් (උදා: පදනම් මට්ටම සහ අවසන් මට්ටම) හෝ වැඩි ගණනක් අතරය. ඇගයුම් කාල ලක්ෂ්‍ය

දෙකකට වැඩි ගණනකදී (උදා: කාලය තුළදී තිරසරභාවය අධ්‍යයනය කිරීම සඳහා වන මැද මට්ටමේදී කරනු ලබන අධ්‍යයනයක් සහ/හෝ මැදිහත්වීම අවසන් වීමෙන් ටික කලකට පසු අධ්‍යයනයක්) ප්‍රතිඵල මැනීම යහපත් භාවිතාවක් ලෙස සැලකේ.

පර්යේෂණාත්මක නොවන ක්‍රමය භාවිතා කිරීමේ ප්‍රධාන සීමාවක් වන්නේ නිරීක්ෂණය කරනු ලබන ඕනෑම ප්‍රතිඵලයක් අවශ්‍යයෙන්ම මැදිහත්වීම සමග සම්බන්ධ නොවීමයි. පහත දැක්වෙන මිශ්‍ර ක්‍රම භාවිතයෙන් මෙම අවදානම් අවම කළ හැකිය. විශ්ලේෂණයේ විශ්වසනීයත්වය වර්ධනය කළ හැකිය. මෙම සැලසුම් සඳහා වියදම් පර්යේෂණාත්මක සැලසුම් සඳහා වියදම්වලට වඩා අඩු විය හැකිය.

ඉහත විස්තර කරන ලද එක් එක් සැලසුම් සඳහා විවිධ ක්‍රම භාවිතා කළ හැකිය.

**ප්‍රමාණාත්මක ක්‍රම:** සංවෘත අවසානයක් තිබෙන ප්‍රශ්න වැනි ප්‍රමාණාත්මක ක්‍රම සකස් කරගනු ලබන්නේ සංඛ්‍යා දත්ත ඇසුරෙනි. වෙනස්කම සිදුවෙමින් තිබේද, ඒ කොපමණ තරමකින්දැයි අවබෝධ කරගැනීමට එය ප්‍රයෝජනවත්ය.

**ගුණාත්මක ක්‍රම:** ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා සහ විවෘත අවසානයක් සහිත ප්‍රශ්න වැනි ගැඹුරු සම්මුඛ සාකච්ඡා වැනි ගුණාත්ම ක්‍රම යොදාගනු ලබන්නේ ලේඛනමය හා ආඛ්‍යානමය විශ්ලේෂණයන් සඳහාය. කාලය තුළ වෙනස සිදුවන්නේ ඇයිද හා කෙසේද යන්න තේරුම්ගැනීමටත්, වැඩසටහන්කරණය සම්බන්ධයෙන් සිදුවන අනපේක්ෂිත ප්‍රතිඵල හෙළිදරව් කිරීමටත් ඒවා ප්‍රයෝජනවත් වේ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඇගයීම හා පර්යේෂණ විශේෂයෙන්මත්, සමාජ සම්මතයන් වැනි ඇතැම් ප්‍රතිඵලත් ප්‍රමාණාත්මකව ගණනය කිරීම දුෂ්කර විය හැකිය. වඩා විවෘත හා ආඛ්‍යානමය ක්‍රම මගින් ඒවා අධ්‍යයනය කළ හැකිය.

**මිශ්‍ර ක්‍රම:** විවිධ ක්‍රම හා මූලාශ්‍ර මගින් දත්ත එක්රැස් කිරීම හා සන්සන්දනය කිරීම විශ්ලේෂණය සම්බන්ධයෙන් විශ්වාසය වර්ධනය කිරීමට උපකාරී විය හැකිය. ඇගයීම් සැලසුම් තුනෙහිදීම ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන ක්‍රම දෙකම භාවිතා කිරීම වැඩි වටිනාකමකින් යුක්ත බව වැඩි වැඩියෙන් පිළිගැනීමට ලක්වෙමින් තිබේ.

**සහභාගීත්ව ක්‍රම:** අසමාන බල සම්බන්ධතා, ගතිකයන් හා සම්මතයන් තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මුල් ඇද තිබෙන පසුබිම තුළ අධීක්ෂණය හා ඇගයීම සඳහා සහභාගීත්ව ක්‍රම වඩා යෝග්‍ය විය හැකිය. සහභාගීත්ව ක්‍රමවලදී මෙම අසමානතා පිළිග න්නා අතර අර්ථවත් සහයෝගය හා අධීක්ෂණය හා ඇගයීම ක්‍රියාවලි සහ ප්‍රතිඵල සමග සම්බන්ධ වීම මගින් කාන්තාවන් හා ප්‍රජාවන් සවිබලගැන්වීමට අරමුණු කරයි.[3] වෙනස් සහභාගිකයන් කණ්ඩායම් විසින් වැඩසටහන සහ ආශ්‍රිත වෙනස්කම් සම්බන්ධ අත්දැකීම් ලබාගන්නා ආකාරය අවබෝධ කරගැනීමට මෙම ක්‍රම ප්‍රයෝජනවත්ය.

## 5. දර්ශක සැලසුම් කිරීම

යෝග්‍ය ඇගයුම් සැලැස්මක් තෝරාගත් පසු, ප්‍රගතිය, ප්‍රතිඵල සහ බලපෑම ග්‍රහණය කරගැනීම සඳහා දර්ශක සංවර්ධනය කරගත යුතුය. එම දර්ශක SMART (Specific - විශේෂිතල Measurable - මිනිය හැකි, Achievable - සාක්ෂාත් කරගත හැකි, Relevant - අදාළ, Time-bound - කාලය තුළ ක්‍රියාත්මක කළ යුතු) විය යුතුය.

1. **ප්‍රතිදාන දර්ශක** මගින් වැඩසටහන් ක්‍රියාකාරකම් සම්පාදනය කිරීමේ ප්‍රගතිය මනිනු ලැබේ. ප්‍රතිදාන දර්ශකවල දත්ත බොහෝවිට එක්රැස් කරනු ලබන්නේ ස්ථාවර අධීක්ෂණය මගිනි.
2. **ප්‍රතිඵල දර්ශක** මගින් වැඩසටහන් මැදිහත්වීම්වල ප්‍රතිඵලයක් ලෙස මධ්‍ය කාලීනව වෙනස මනිනු ලැබේ. ප්‍රතිඵල පිළිබඳ දත්ත සාමාන්‍යයෙන් එක්රැස් කරනු ලබන්නේ ඇගයීම මගිනි.
3. **බලපෑම් දර්ශක** මගින් වැඩසටහනක දිගුකාලීන බලපෑම මනිනු ලැබේ. බලපෑම් දර්ශකවල දත්ත එක්රැස් කරනු ලබන්නේ ඇගයීම මගිනි.

අධීක්ෂණය හා ඇගයීම ප්‍රශ්නවල ස්වභාවය අනුව, මට්ටම් තුනේදීම ප්‍රමාණාත්මක හා ගුණාත්මක දර්ශක භාවිතා කළ හැකිය. RESPECT මූලෝපායන් හත පිළිබඳ දර්ශක සංවර්ධනය කිරීම සහ දත්ත එක්රැස් කිරීමේ මෙවලම් පිළිබඳ වැඩිදුර මගපෙන්වීම් A ඇමුණුමෙහි දැක්වේ.

## 6. අධීක්ෂණය හා ඇගයීම මෙවලම් සංවර්ධනය කිරීම

දර්ශක පිළිබඳ එකඟ වූ පසු, ඒවා මැනීම සඳහා දත්ත එක්රැස් කිරීමේ මෙවලම් සැලසුම් කළ යුතුය. දත්ත මූලාශ්‍ර රැසක් තිබේ. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා ඒ හා සම්බන්ධ ආකල්ප, චර්යාවන් සහ සමාජ සම්මතයන් මැනීම සඳහා දැනට තිබෙන මෙවලම් ගෝලීය පරිමාණයෙන් භාවිතා කරනු ලැබේ. ප්‍රමාණාත්මක සමීක්ෂණ සඳහා ප්‍රමිතිගත ප්‍රශ්න පහත දැක්වෙන ප්‍රශ්නාවලිවල දැක්වේ. ජාතික මට්ටමෙන් ජනගහනයේ දත්ත එක්රැස් කිරීම සඳහා බොහෝ රටවල ඒවා භාවිතා කර තිබේ. මෙම නිශ්චිත දර්ශක භාවිතා කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ A ඇමුණුමෙහි දැක්වේ.

- The World Health Organization (WHO) multicountry study on women's health and domestic violence (WHO MCS).[4]
- The Domestic Violence Module of the Demographic and Health Survey (DHS).[5]
- The United Nations Children's Fund (UNICEF) Multiple Indicator Cluster Survey (MICS).[6]
- International Men and Gender Equality Survey (IMAGES).[7]
- The UN multi-country cross-sectional study on men and violence in Asia and the Pacific (UN MCS).[8]
- The Violence Against Children Survey (VACS).[9]

මෙම සමීක්ෂණවලින් සකස්කරගන්නා ලද **ප්‍රමිතිගත ප්‍රශ්න** පහත දැක්වෙන ආකාරයට ඇතුළත් කිරීම යහපත් භාවිතාවක් ලෙස සලකනු ලැබේ.

» සමාජභාවය, වයස, ආබාධිත තත්වය ඇතුළු පෞද්ගලික ජනවිකාස දත්ත[10]

» සංයුතිය, ආදායම, වත්කම් ආදී ගෘහස්ථ සමාජ ආර්ථික දත්ත

» සමාජභාවී සමානාත්මතාව සහ විශේෂිත කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වර්ග පිළිබඳ ආකල්ප[11]

» විවිධ නිශ්චිත වර්ගවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ අත්දැකීම් (කාන්තාවන් සඳහා)
» උපකාර ඉල්ලීමේ සහ සේවා වෙත පිවිසීමේ චර්යාවන් (කාන්තාවන් සඳහා)[12]

විශේෂිත සංදර්භයන් අනුව ප්‍රචණ්ඩත්වයේ වර්ග, වැඩසටහන් සැලසුම්, වෙනස්කම් කිරීමේ න්‍යාය සහ විශේෂිත ඉලක්ක ජනගහනයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අත්දැකීම් සහ වැරදි කිරීම සම්බන්ධ වැදගත් දත්ත සහ අවදානම් සාධක ලබාදීම සඳහා **විකල්ප මොඩියුල** ද ලබාදිය හැකිය.

» මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය (ප්‍රමාණය, නිරන්තරභාවයේ මට්ටම)[13]
» මානසික සෞඛ්‍යය සහ විශාදය[14]
» විශේෂිත ස්වරූපවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වැරදි කිරීම (පිරිමින්, ගැහැණුන් සඳහා)[15]
» ළමයින් හදාවඩාගැනීම හා විනයගත කිරීම සම්බන්ධ ආකල්ප සහ භාවිතාවන්[16]
» කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී බේරුණු පුද්ගලයන් සම්බන්ධ ආකල්ප[17]
» සමාජ සම්මතයන් සහ යොමුකිරීම් කණ්ඩායම් අවබෝධ කරගැනීම සඳහා වෙනත් අයගේ ආකල්ප සම්බන්ධ දැක්ම[18]

එයට අමතරව, කාන්තාවන්, පිරිමින්, ප්‍රජා පහසුකම් සපයන්නන්, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල, ප්‍රජා නායකයන්, කාන්තා අයිතිවාසිකම් සංවිධාන සහ සේවා සම්පාදකයන් සමග ගැඹුරු සම්මුඛ සාකච්ඡා, ඉලක්ක කණ්ඩායම් සහ ප්‍රජා වැඩමුළු සඳහා සංවර්ධනය කරන ලද ගුණාත්මක මෙවලම් රැසක් තිබේ. කරුණු අනාවරණය කරන කතා භාවිතා කිරීම සමාජ සම්මතයන් හැදෑරීම සඳහා ප්‍රයෝජනවත් ක්‍රමයකි.[19]

## 7. පර්යේෂණ, අධීක්ෂණය හා ඇගයීම සහායට අනුරූප වීම (adaptation) හා පුළුල් කිරීම (scaling-up)

පර්යේෂණ, අනුරූප වීමට උපකාර කිරීම සඳහා අධීක්ෂණය හා ඇගයීම සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් පුළුල් කිරීම මෙහෙයවීමේදී සිතෙහි තබාගත යුතු වැඩිදුර සලකාබැලීම් ගණනාවක් තිබේ.

**අනුරූප වීම:** වැළැක්වීමේ ප්‍රවේශයන්, උපාංග සහ මාදිලි දේශීය සංදර්භයන්ට යෝග්‍ය බව තහවුරු කිරීම සඳහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන්වලට සාර්ථක ලෙස අනුරූප වීම සඳහා සංවර්ධනාත්මක පර්යේෂණ (formative research) ඉතා වැදගත් වේ. පර්යේෂණ සහ අධීක්ෂණය හා ඇගයීම මගින් අනුරූප වීමට සහාය විය හැකි අමතර ක්‍රම රැසක් තිබේ.

- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් අනුරූප කරගැනීමේදී මුල් වැඩසටහනේ ප්‍රධාන මූලිකාංගවලට අනුකූලතාවආරක්ෂා කරගැනීම වැදගත්ය. අධීක්ෂණ දත්ත මගින් අනුකූලතාව අධීක්ෂණය කළ හැකි අතර ප්‍රධාන මූලිකාංග සහ වටිනාකම් නඩත්තු කළ හැකිය.
- වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලි ඇගයීම (එනම්, ආදාන, ක්‍රියාකාරකම්, ප්‍රොටොකෝල සහ පටිපාටි) වැඩසටහන්වලට සාර්ථක වන්නේ කුමක්ද, අසාර්ථක වන්නේ කුමක්ද, අමතර අනුරූප කිරීම් අවශ්‍ය වේද යන්න තේරුම්ගැනීම සඳහා උපකාර වේ.

**පුළුල් කිරීම:** WHO/ExpandNet සාමූහිකය විසින් පුළුල් කිරීම පහත දැක්වෙන ආකාරයට අර්ථ නිරූපණය කර තිබේ. 'නියාමන හෝ පර්යේෂණාත්මක ව්‍යාපෘතිවල සාර්ථක ලෙස පරීක්ෂා කරන ලද නවෝත්පාදනයන්ගේ බලපෑම වැඩිකිරීම සඳහා සිතාමතා දරන ප්‍රයත්නයන්හි අරමුණ වන්නේ වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබාදීම සහ කල්පවත්නා පදනමකින් ප්‍රතිපත්ති සහ වැඩසටහන් සංවර්ධනය කිරීමයි.'[20] Community for Understanding Scale-Up (CUSP) යනු, සමාජ සම්මතයන් වෙනස් කිරීමේ වැඩසටහන් සංවර්ධනය, අනුරූප වීම සහ පුළුල් කිරීම සඳහා ක්‍රියාත්මක වන සංවිධාන සමූහයකි. එම වැඩසටහන් අතරට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ සමාජභාවී සමානාත්මතාව අයත් වේ. එමගින් පුළුල් කිරීම සඳහා නිර්දේශ නිර්මාණය කර තිබේ. ඒවායින් ඇතැම් ඒවා පර්යේෂණ හා අධීක්ෂණය හා ඇගයීම සඳහා බලපෑම් කරයි.[21]

- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන් අවශ්‍ය ප්‍රමාණයට පුළුල් කර ක්‍රියාත්මක කිරීමේදී අනුකූලතාව (Fidelity) අතිශය වැදගත්ය. එහෙත්, කාලසීමාවන්, පුහුණුව සහ මාර්ගෝපදේශනය, ක්‍රියාකාරකම්වල නිරන්තරභාවය හෝ ආවරණය පුළුල් කිරීම සඳහා වන වෙනත් වැඩසටහන් මූලිකාංග අවම කරගැනීම සඳහා සම්පත් හිඟය සහ වියදම් අරපිරිමසාගැනීමේ උවමනාව නිසා මතුවන ඉල්ලීම් හේතුවෙන් බොහෝවිට අනුකූලතාවට බලපෑම් ඇතිවේ. එබැවින්, අනුකූලතාව පරීක්ෂා කිරීම සඳහා අධීක්ෂණ දත්ත භාවිතා කළ යුතුය. මූලික වැඩසටහන් අංග පවත්වාගෙන යන බව එමගින් තහවුරු කළ යුතුය.
- අහඹු ලෙස කරනු ලබන පාලන අත්හදාබැලීමක් (RCT) හෝ වෙනත් වර්ගයක පර්යේෂණාත්මක හෝ අර්ධ පර්යේෂණාත්මක ඇගයීමක් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ වැඩසටහන්වල බලපෑම තක්සේරු කිරීමේදී යෝග්‍ය විය හැකිය. එහෙත්, පුළුල් පරිමාණයෙන් වැඩසටහන්කරණයෙහි ඵලදායීතාව ඇගයීම සඳහා එවැනි ප්‍රවේශයක් ඇගයීම සඳහා යෝග්‍ය නොවිය හැකිය. පුළුල් පරිමාණ වැඩසටහන් සම්බන්ධයෙන් වෙනස සඳහා යාන්ත්‍රණයන් සහ ගමන් මාර්ග අවබෝධ කරගැනීම සඳහා වෙනත් ක්‍රමවේද අවශ්‍ය වනු ඇත.

## කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධ සමීක්ෂණ ආචාරධර්ම

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැඩසටහන්කරණය සම්බන්ධ අධීක්ෂණය හා ඇගයීම මෙහෙයවීම මගින් ආචාරධාර්මිකත්වය හා ආරක්ෂාව සම්බන්ධ අභියෝග රැසක් මතුවේ. ඒ, සාමාන්‍යයෙන් වෙනත් වැඩසටහන් අංශවල අධීක්ෂණය හා ඇගයීම තුළදී සාමාන්‍යයෙන් සිදුවන දේට අමතරවය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ආචාරධාර්මික සමීක්ෂණ සිදුකිරීමේ මූලධර්ම අටක් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2001දී සංවර්ධනය කරන ලදී (එය 2016දී යාවත්කාලීන කරන ලදී). එය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වැඩසටහන්කරණයේදී අදාළය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සමීක්ෂණ හෝ ඇගයීම් අධ්‍යයනයන් සැලසුම් කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී සහ බෙදාහැරීමේදී අදාළ වන එක් එක් මූලධර්මයන්ගේ සාරාංශයක් 1 වගුවෙහි දැක්වේ.[22] ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආචාරධර්ම මාර්ගෝපදේශ ලේඛන දෙකෙහි සම්පූර්ණ නිර්දේශ කට්ටලය තිබේ.[23] පහත දැක්වෙන ප්‍රධාන මූලධර්ම අටට අතිරේක ආචාරධර්ම මූලධර්ම මෑතකාලීන ලෝක සෞඛ්‍ය සංවිධාන මාර්ගෝපදේශවල අඩංගු වේ. ඇතැම් ඒවා අධීක්ෂණ හා ඇගයීම් ක්‍රමවේදවල හා ප්‍රවේශයන්ගේ විශේෂිත ස්වරූපවලට නිශ්චිත වේ.

### 1 වගුව: කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ ආචාරධාර්මික සමීක්ෂණ සඳහා වන ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූලික මූලධර්ම

**1** **ප්‍රතිචාර දක්වන්නන්ගේ සහ සමීක්ෂණ කණ්ඩායමේ ආරක්ෂාව ඉතා වැගත් වන අතර සියලු ව්‍යාපෘති තීරණවලට එමගින් මගපෙන්විය යුතුය.**

- ✓ සහභාගී වන්නන්ගේ දැනුවත් කැමැත්ත ලබාගන්නා බව සහතික කරන්න. එයට අඛණ්ඩව සිදුවන සිරස් (longitudinal) ඇගයීම් හෝ සමීක්ෂණ ද ඇතුළත් වේ.
- ✓ පෞද්ගලික පසුබිම්වලදී සම්මුඛ සාකච්ඡා මෙහෙයවන්න.
- ✓ අධ්‍යයනය කාන්තාවන්ගේ සෞඛ්‍යය හෝ පවුල් සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනයක් ලෙස ප්‍රතිචාර දක්වන්නන්ට, පවුල් සාමාජිකයන්ට සහ ප්‍රජාවට විස්තර කරන්න.
- ✓ ගෘහස්ථ හිංසනය සම්බන්ධයෙන් නිවසකින් එක් කාන්තාවක පමණක් සම්මුඛ සාකච්ඡාවට ලක්කරන්න. නිවසේ වෙනත් සාමාජිකයන් සම්මුඛ සාකච්ඡාවට ලක්කිරීමේදී ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රශ්න නොඅසන්න. යුවල වැඩසටහනක කොටසක් ලෙස සහකරු/ සහකාරියන් දෙදෙනාම සම්මුඛ සාකච්ඡාවට ලක්කරන විට පමණක් මෙය වෙනස් වේ. එවැනි අවස්ථාවලදී අවදානම බොහෝදුරට අවම වන අතර වැඩසටහන විසින් ආධාර අනුබල සැපයිය හැකිය.
- ✓ බාධා සමග කටයුතු කිරීම සඳහා සම්මුඛ සාකච්ඡාකරුවන් පුහුණු කළ යුතුය.

ක්‍රියාත්මක කිරීම අධ්‍යයනය කිරීමට පෙර, සංස්කෘතික වශයෙන් යෝග්‍ය අධ්‍යයන මෙවලම් සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා සංවර්ධනාත්මක සමීක්ෂණයක් හා පාර්ශ්වකාර විශ්ලේෂණයක් පවත්වන්න.

**2** **අධ්‍යයනයන් ක්‍රමවේදී වශයෙන් ප්‍රබල විය යුතුය. ප්‍රචණ්ඩත්වය අඩුවෙන් වාර්තා වීම පිළිබඳ වර්තමාන සමීක්ෂණ අත්දැකීම අනුව සම්පාදනය කළ යුතුය.**

- × කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ වැඩසටහන් වෙනුවෙන් දුර්වල ලෙස සැලසුම් කරන ලද සහ ක්‍රියාත්මක කරන ලද අධීක්ෂණයන් හා ඇගයීම් ආචාරධාර්මික නොවේ. එමගින් සම්පත් නාස්ති වේ. එය කාන්තාවන් ප්‍රචණ්ඩත්වය අඩුවෙන් වාර්තා කිරීමට පොළඹවයි. කාන්තාවන් හානි සම්බන්ධ වැඩි අවදානමකට ලක්කළ හැකිය.
- ✓ යෝග්‍ය මෙවලම් හා ක්‍රම භාවිතා කළ යුතුය. ආරක්ෂිතව තම කාර්යය කරන ආකාරය පිළිබඳ සම්මුඛ සාකච්ඡාකරුවන් පුහුණු කළ යුතුය.

**3** **කාන්තාවන්ගේ හා දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා රහස්‍යභාවය ආරක්ෂා කිරීම අත්‍යවශ්‍යය.**

- ✓ සම්මුඛ සාකච්ඡාකරුවන් රහසිගතභාවයේ වැදගත්කම තේරුම්ගැනීම සහතික කරන්න. ඔවුන් ඒ අනුව පුහුණු කළ යුතුය.
- × ප්‍රශ්නාවලිවල සහභාගිකයන්ගේ නම් සටහන් නොකරන්න. ඒ වෙනුවට සුවිශේෂ අනන්‍යතා කේත භාවිතා කර ඒවා දත්තවලින් වෙන්කර තබාගන්න.
- ✓ දත්ත එක්රැස් කිරීම සඳහා ටැබ්ලට් පරිගණක හෝ වෙනත් ඩිජිටල් උපාංග භාවිතා කරන්නේ නම්, ඒවා මුරපද යොදා ආරක්ෂා කර ඇති බව හා දත්ත එන්ක්‍රිප්ට් කර ඇති බව තහවුරු කරන්න.
- ✓ සියලු දත්ත ආරක්ෂිත අල්මාරි තුළ හෝ මුරපද මගින් ආරක්ෂා කරන ලද විද්‍යුත් ගොනු තුළ තබාගැනීමට කටයුතු කරන්න.
- ✓ ප්‍රකාශ පටිගත කරගැනීමට පෙර සහභාගී වන්නන්ගේ කැමැත්ත විමසන්න. ලේඛනගත කරගැනීමෙන් පසු එම ශබ්ද ගොනු මකාදමන්න.
- ✓ වාර්තා කිරීමේදී ප්‍රමාණවත් තරමින් දත්ත රැස්කරගෙන තිබේදැයි සැලකිලිමත් වන්න. එහිදී විශේෂිත ප්‍රජාවක් හෝ පුද්ගලයකු වෙන්කර හඳුනාගත නොහැකි විය යුතුය.
- ✓ සහභාගී වූවන් සිරස් අධ්‍යයනවලදී හෝ පසු විපරම් දත්ත එක්රැස් කිරීම්වලදී නැවත හමුවීමේදී ආරක්ෂිත සහ යෝග්‍ය ක්‍රම භාවිතා කරන බව තහවුරු කරන්න.

**4**

**සමස්ත සමීක්ෂණ කණ්ඩායමම පරිස්සමෙන් තෝරාගත යුතුය. ඔවුන්ට අඛණ්ඩව සුවිශේෂ පුහුණුවීම් ලබාදිය යුතුය.**

- ✓ සමීක්ෂණ හා අධීක්ෂණය හා ඇගයීම කාර්ය මණ්ඩල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, සමාජභාවී සමානාත්මතාව සහ ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන් සම්බන්ධයෙන් තමන්ගේම සමාජභාවය ආශ්‍රිත අගතීන් හා ඒකාකෘති දැනුවත්ව මගහරවා ගන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් පුහුණු වී තිබිය යුතුය.
- ✓ දත්ත එක්රැස් කරන්නන් ඇතුළු කාර්ය මණ්ඩලය ද පුහුණුව ලබා තිබිය යුතුය. සම්මුඛ සාකච්ඡා හේතුවෙන් කාර්ය මණ්ඩලයට ද්විතීයක ක්ෂතිමය අත්දැකීම් ලැබිය හැකි බැවින් ඔවුන්ට අඛණ්ඩව සහාය ලබාදිය යුතුය. ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් කාර්ය මණ්ඩලවලට අතීත ක්ෂතිමය අත්දැකීම් පිළිබඳ මතකයන් නැවත අවදි වී පීඩාවන් ඇතිවිය හැකිය.

අධ්‍යයනයට සහභාගී වන අයට එරෙහිව ප්‍රචණ්ඩත්වය භාවිතා කරන්නන් වෙතින් කාර්ය මණ්ඩලයට වෙත ද ප්‍රචණ්ඩත්වය එල්ලවීමේ අවදානමක් තිබේ. එබැවින් ඔවුන්ට ආරක්ෂිත ප්‍රවාහනය, යෝග්‍ය සන්නිවේදන තාක්ෂණයන් හා ක්‍රියාවලි වැනි ආරක්ෂක සහයෝගීතාවන් හා සැපයුම් අඛණ්ඩව අවශ්‍යය.

**5**

**සමීක්ෂණය හේතුවෙන් සහභාගිකයන්ට සිදුවිය හැකි විපත් අවම කිරීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග අධ්‍යයන සැලසුමට ඇතුළත් විය යුතුය.**

- ✓ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීම හෝ එසේ කිරීම පිළිබඳ අත්දැකීම් පිළිබඳ ප්‍රශ්න සම්මුඛ සාකච්ඡාව ආරම්භයේදී හෝ අවසානයේදී ඍජුවම නොඅසන බවට වගබලාගන්න.
- ✓ සහායක සහ විනිශ්චයක් මත නොපිහිටි ආකාරයෙන් ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රශ්න ඇසීමට සම්මුඛ සාකච්ඡාකරුවන් පුහුණු කරන්න.
- ✓ බේරුණු පුද්ගලයන්ට සම්මුඛ සාකච්ඡාව නිසා සිදුවිය හැකි බලපෑම් පිළිබඳ අවබෝධ කරගත හැකි ලෙස සම්මුඛ සාකච්ඡාකරුවන් පුහුණු කරන්න. විපත්වලට ප්‍රතිචාර දක්වන ආකාරය සහ අවශ්‍ය නම් සම්මුඛ සාකච්ඡාවක් අවසන් කරන ආකාරය පුහුණු කරන්න.

**6**

**සහාය අපේක්ෂා කරන කාන්තාවන් සපයාගත හැකි දේශීය සේවාවන් හා සහායක සම්පත් වෙත යොමු කිරීම සඳහා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය පුහුණු කළ යුතුය. සම්පත් සීමිත විටදී, අධ්‍යයනය මගින් කෙටිකාලීන සහායක යාන්ත්‍රණයන් සම්පාදනය කරගත යුතුය.**

- ✓ දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාකාරකම්වලට පෙර, කාන්තාවන්ට සහාය ලබාදීම සඳහා යොමු කළ හැකි පුද්ගලයන් හා කාන්තා සංවිධාන ඇතුළු ආයතන හඳුනාගන්න. සෞඛ්‍ය, නීති හා සමාජ සේවා සම්පාදනය කළ හැකි විය යුතුය.
- ✓ දත්ත එක්රැස් කිරීමේදී ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සමග පුහුණු උපදේශන සේවා සම්පාදකයකු යන බව තහවුරු කරන්න. එමගින් කාන්තාවන්ට අවශ්‍ය සේවා සම්පාදනය ප්‍රමාණවත් නොවන පසුබිම්වලදී ඔවුන්ට ම උපදේශන සේවා සැපයිය හැකිය.

**7**

**සමීක්ෂකයන් හා ආධාරකරුවන් සතුව තම සොයාගැනීම් නිසි ලෙස අර්ථකථනය කිරීමේ සහ ප්‍රතිපත්ති හා මැදිහත්වීම් සංවර්ධනය කිරීම සඳහා භාවිතා කිරීමේ ආචාරධාර්මික වගකීම් තිබේ.**

- ✓ සමීක්ෂණ හා අධීක්ෂණය හා ඇගයීම ප්‍රතිඵල සමීක්ෂණයට සහභාගී වූ කණ්ඩායම්වලට යෝග්‍ය ප්‍රතිපත්ති, උද්දේශන සහ මැදිහත්වීම් ක්‍රියාකාරකම් පෝෂණය කිරීම සඳහා භාවිතා කරන බව සහතික කරන්න.
- ✓ සොයාගැනීම් වලංගු කිරීමේදී, බෙදාහැරීමේදී සහ භාවිතා කිරීමේදී භූමිකාවක් ඉටුකළ හැකි උපදේශක කමිටු හෝ පාර්ශ්වකාර ක්‍රියාකාරී කණ්ඩායම් පිහිටුවන්න.

**8**

**ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රශ්න වෙනත් අරමුණු වෙනුවෙන් සැලසුම් කරන ලද සමීක්ෂණවලට සම්බන්ධ කළ යුත්තේ ආචාරධාර්මික හා ක්‍රමවේද අවශ්‍යතා සම්පූර්ණ වන්නේ නම් පමණි.**

- ✓ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රශ්න වෙනත් අරමුණු හා තේමා වෙනුවෙන් සැලසුම් කරන ලද අධ්‍යයන හා අධීක්ෂණය හා ඇගයීම ක්‍රියාකාරකම්වලට ඇතුළත් කිරීම සිදුකළ යුත්තේ මෙහි ඉදිරිපත් කර තිබෙන මූලධර්ම අටෙන් විස්තර කරනු ලබන ආචාරධාර්මික හා ක්‍රමවේදී ප්‍රමිතිවලට අනුකූල වන්නේ නම් පමණි.

# අධීක්ෂණය සහ ඇගයීම

ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආචාරධාර්මික මාර්ගෝපදේශ ලේඛන විසින් ළමයින්ට හා නව යෞවනයන්ට එරෙහිව කරනු ලබන ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් සමීක්ෂණ හෝ අධීක්ෂණය හා ඇගයීම සිදුකිරීම සම්බන්ධ වන විශේෂිත අවදානම් සම්බන්ධයෙන් කටයුතු කරන්නේ නැත. ඒ වෙනුවෙන් ඉහත දක්වන ලද ක්‍රියාවලි සහ ප්‍රවේශයන්ට අතිරේක ක්‍රියාවලි සහ ප්‍රවේශයන් අවශ්‍ය වේ. ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ දත්ත එක්රැස් කිරීමේ මාර්ගෝදේශ ලේඛන ගණනාවක් තිබේ. ඒ අතරින් තෝරාගත් කීපයක් පහත දැක්වේ. 1 වගුවේ දැක්වෙන ආචාර ධාර්මික සමීක්ෂණ පිළිබඳ මූලධර්ම බොහෝදුරට ළමයින්ට අදාළ වන නමුදු, ළමයින්ට හා නව යෞවනයන්ට අදාළ වන අතිරේක මූලධර්ම තිබේ. ඒවායේ සාරාංශයක් 2 වගුවෙහි දැක්වේ.[24]

## 2 වගුව: ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ ආචාරධාර්මික සමීක්ෂණ සම්බන්ධ අතිරේක මූලධර්ම

**ස්වේච්ඡා අනුමැතිය සහ කැමැත්ත**

වයස අවුරුදු 18ට අඩු ළමයින්ට සාමාන්‍යයෙන් සමීක්ෂණ හා අධීක්ෂණය හා ඇගයීම සඳහා නීතිමය කැමැත්ත ලබාදීමේ හැකියාව නැත. ඔවුන් වෙනුවෙන් කැමැත්ත ලබාදිය යුත්තේ මව්පියන් හෝ භාරකරුවන්ය. කෙසේ වෙතත්, මව,පියා හෝ භාරකරුවකුගේ කැමැත්තට යටත්ව සහභාගී වීම සම්බන්ධයෙන් ස්වේච්ඡා, දැනුවත් අනුමැතිය පළකිරීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අවස්ථාව ළමයින්ට ලබාදිය යුතුය. මව්පිය කැමැත්ත සලකා බලනවාද නැතිනම් නොතකා හරිනවාද යන කරුණ සලකා බැලීමට සමීක්ෂකයන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කරන්නන් සූදානමින් සිටිය යුතුය. උදාහරණයක් ලෙස, සමීක්ෂණය හෝ අධීක්ෂණය හා ඇගයීම පිළිබඳ මව්පියන් දැනගැනීම මගින් ළමයින් ප්‍රචණ්ඩත්වයේ හෝ අපයෝජනයේ අවදානමට ලක්වෙනවා නම් එසේ කළ යුතුය.[25]

- ✓ අධ්‍යයනය විස්තර කිරීමට හා අනුමැතිය ලබාගැනීමට භාවිතා කරනු ලබන භාෂාව (ලිඛිත හෝ වාචික) ළමයාගේ වයසට යෝග්‍යදැයි තහවුරු කරගන්න.
- ✓ ළමයින්ගේ අනුමැතිය ස්වේච්ඡාවෙන් ලැබෙන්නේද යන්න පැහැදිලි කරගන්න. සහභාගී වීම ප්‍රතික්ෂේප කිරීමෙහි නිශේධාත්මක ප්‍රතිඵල නොමැති බව ද තහවුරු කරන්න.
- ✓ අනුමැතිය/ කැමැත්ත ලබාගැනීමේදී, ළමයින් හා මව්පියන්/ භාරකරුවන් විශ්වසනීයත්වයේ තිබිය හැකි සීමා සම්බන්ධයෙන් දැනුවත් කිරීමට වගබලාගන්න. උදාහරණයක් ලෙස, ළමා අපචාර පිළිබඳ අනිවාර්ය වාර්තාකරණයේ නීතිමය අවශ්‍යතාව රහස්‍යභාවයේ අවශ්‍යතාවට වඩා වැදගත් විය හැකිය (විස්තර පහත දැක්වේ).

**හානි අවදානම අවම කිරීම**

ප්‍රතිචාර දක්වන්නන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම හා ඔවුන්ට හානි සිදුවීමේ අවදානම අවම කිරීම සෑම සමීක්ෂණයකදීම ඉතා වැදගත්ය. කෙසේ වෙතත්, ළමයින් සමග දත්ත එක්රැස් කිරීම, විශේෂයෙන්ම ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මාතෘකාවලදී පහත දැක්වෙන විශේෂිත අවදානම් නිර්මාණය කරන්නට ඉඩ තිබේ.

- ✓ සමීක්ෂණ ප්‍රොටොකෝල මගින් ළමයින්ට තිබිය හැකි සියලු අවදානම් හඳුනාගන්නා බව තහවුරු කරන්න.
- ✓ ළමයින්ට සිදුවිය හැකි අවදානම් හඳුනාගැනීම සඳහා දැනුවත් දේශීය පාර්ශ්වකරුවන්ගේ උපදෙස් ලබාගන්න.
- ✓ ළමයින් සමග සමීක්ෂණ කිරීම හා දත්ත එක්රැස් කිරීම සම්බන්ධයෙන් සමීක්ෂණ කණ්ඩායමට පුහුණුව ලබාදී තිබෙන බව තහවුරු කරන්න. එම පුහුණුවට සංවේදී මාතෘකා ද, ළමයින්ගේ විපත්වලට ප්‍රතිචාර දක්වන ආකාරය ද අයත් වේ.
- ✓ ළමා අපයෝජන අධිකාරීන් වෙත දැනුම්දීමේ අනිවාර්ය අවශ්‍යතාවේදී ඇතිවිය හැකි ඇඟවුම් සහ අවදානම් කළමනාකරණය කරගැනීමට සූදානම් වන්න. මෙම අවශ්‍යතා විවිධ සංදර්භයන්හිදී විවිධ වේ. ඒවායින් ඇතිවිය හැකි වාසි සහ වාර්තා කිරීමේ අවදානම විශ්ලේෂණය කළ යුතුය. සංස්කෘතික සහ නීතිමය සංදර්භය අනුව තුලනය කරගත යුතුය.
- ✓ සමීක්ෂණ කණ්ඩායම සමග පුහුණු උපදේශන සේවා සම්පාදකයකු යන බව තහවුරු කරන්න. එමගින් අවශ්‍ය උපදේශන සේවා සැපයිය හැකිය.

# ප්‍රයෝජනවත් සම්පත්

## අධීක්ෂණය හා ඇගයීම මාර්ගෝපදේශ

Programming Essentials, Monitoring & Evaluation. UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls.
UNWOMEN's Virtual Knowledge Center හි මාර්ගෝපදේශ, සිද්ධි අධ්‍යයන සහ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම සහ වැළැක්වීම සම්බන්ධ බලපොරොත්තු ඇතිකරන භාවිතාවන් පිළිබඳ උදාහරණ ඇතුළු අදාළ සම්පත් පරාසයක් ඇත.

Global Women's Institute (2019) Participatory Monitoring and Evaluation (M&E) of Gender Based Violence Programs. SVRI Pre-Conference Workshop October 2019, The Global Women's Institute, George Washington University.
මෙම ස්ලයිඩ් එකතුව භාවිතා කරනු ලැබුවේ Sexual Violence Research Initiative හි ද්විවාර්ෂික සහභාගීත්ව අධීක්ෂණ හා ඇගයුම් වැඩමුළුවක පූර්ව කටයුතුවලදීය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ සමාජභාවී ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සහභාගීත්ව අධීක්ෂණ හා ඇගයීම් ප්‍රවේශයන්හිදී භාවිතා කරනු ලබන ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීමේ මූලධර්ම එහි අඩංගු විය.

UNICEF (2018) INSPIRE Indicator Guidance and Results Framework. New York: UNICEF.
INSPIRE මූලෝපායන් හත තුළ ප්‍රගතිය අධීක්ෂණය කිරීමට හා කාලය තුළ වෙනස අධ්‍යයනය කිරීම සඳහා රජයන්ට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපකාර කිරීම සඳහා සැලසුම් කර තිබේ. ප්‍රතිඵල රාමුවක් සහ මූලික දර්ශක කට්ටලයක්, එය භාවිතා කරන ආකාරය පිළිබඳ සවිස්තර මාර්ගෝපදේශ සමග මෙම ලේඛනයෙහි අඩංගු වේ.

ANROWS (2017) Counting on change. A guide to prevention monitoring. Australian National Research Organisation for Women's Safety.
ප්‍රතිපත්ති සම්පාදකයන්, පර්යේෂකයන් සහ උද්දේශකයන් සඳහා වන, කාන්තාවන්ට හා ඔවුන්ගේ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය මැඩීම හා සම්බන්ධ ජනගහන මට්ටමේ ප්‍රගතිය මැනීමේ මාර්ගෝපදේශයකි.

DFID (2012) How to Note: Guidance on Monitoring and Evaluation for Programming on Violence against Women and Girls. CHASE Guidance Note Series.
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධ වැඩසටහන්වල වැදගත් අවධි හතරක් විස්තර කරයි. අධීක්ෂණ හා ඇගයීම් චක්‍රයේ සෑම මට්ටමකදීම එය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ සවිස්තර මාර්ගෝපදේශයක් සපයයි.

Bloom, S.S. (2008) Violence Against Women and Girls: A Compendium of Monitoring and Evaluation Indicators. Measure Evaluation, for the USAID East Africa Regional Mission and Inter-agency Gender Working Group.
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වැඩසටහන් අධීක්ෂණයේ හා ඇගයීමේ පරිපූර්ණ දර්ශක සංග්‍රහයකි. දර්ශක අර්ථ නිරූපණවල මාර්ගෝපදේශ, එම දර්ශක මැනිය යුතු ආකාරය හා දත්ත එක්රැස් කිරීම සඳහා භාවිතා කළ හැකි මෙවලම් එහි තිබේ.

Ellsberg, M. & Heise, L. (2005) Researching Violence Against Women: A Practical Guide for Researchers and Activists. World Health Organization, PATH.
ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ හා වැළැක්වීමේ ක්ෂේත්‍රයේ යෙදීසිටින පර්යේෂකයන් සඳහා අත්පොතකි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ අන්තර්ගතයන් අඩංගු සමීක්ෂණ සිදුකිරීමේ ක්‍රමවේදීය හා ආචාරධාර්මික අභියෝග සහ එම අභියෝගවලදී අනුගමනය කළහැකි නිර්මාණාත්මක තාක්ෂණයන් එහි අඩංගු වේ.

## ආචාරධර්ම සහ ආරක්ෂාව - කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය

WHO (2016) Ethical and safety recommendations for intervention research on violence against women. Building on lessons from the WHO publication Putting women first: ethical and safety recommendations for research on domestic violence against women. Geneva: World Health Organization.
කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සමීක්ෂණ සිදුකිරීමේදී අනුගමනය කළ යුතු ආචාරධාර්මික හා ආරක්ෂක නිර්දේශ (පහත දැක්වේ) පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ 2001 මුල් ලේඛනයේ යාවත්කාලීන කිරීමකි. ඒවා පදනම් වන්නේ, අමතර ක්‍රියාමාර්ග සහ යහපත් භාවිතාවන් තහවුරු කිරීම සඳහා වන වඩා මෑතකාලීන සාක්ෂි හා අධ්‍යයනයන් මතය.

WHO (2001) Putting Women First: Ethical and Safety Recommendations for Research on Domestic Violence Against Women. Geneva: World Health Organization.
ලෝක සෞඛ්‍ය සංවිධානයේ කාන්තා සෞඛ්‍යය සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ බහු රාජ්‍ය අධ්‍යයනයේ  කොටසක් ලෙස සම්පාදනය කරන ලද මාර්ගෝපදේශ ලේඛනයයි. එහි මූලික ආචාරධාර්මික හා ආරක්ෂක මූලධර්ම අවධාරණය කරනු ලැබේ. ඒවා මෙහෙයවන ආකාරය පිළිබඳ විස්තරයක් ද අඩංගු වේ.

## ආචාරධර්ම සහ ආරක්ෂාව - ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය

UNICEF (2018) INSPIRE Indicator Guidance and Results Framework. New York: UNICEF.
මෙම ලේඛනය විසින් INSPIRE මූලෝපායන්වල ප්‍රතිඵල ව්‍යුහය සහ දර්ශක සම්බන්ධ මාර්ගෝපදේශය වෙත අවධානය යොමුකරනු ලබන නමුත්, ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ දත්ත එක්රැස් කිරීම හා සම්බන්ධයෙන් ද එහි පරිච්ඡේදයක් අඩංගු වේ.

CP MERG (2012) Ethical principles, dilemmas and risks in collecting data on violence against children: A review of available literature. New York: Statistics and Monitoring Section/ Division of Policy and Strategy, UNICEF.
මෙය මාර්ගෝපදේශ ලේඛනයක් නොවේ. එය ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ ආචාරධාර්මික සමීක්ෂණ මාර්ගෝපදේශයන්ගේ අනාගත පදනම නිර්මාණය කිරීමේ ලේඛන සමූහයක් සහ සමාලෝචනයකි. ලේඛනය විසින් ළමයින් සමග සමීක්ෂණ සිදුකිරීම හා සම්බන්ධ විවිධ මූලධර්ම, අර්බුද සහ පර්යේෂකයන් මුහුණදිය හැකි අවදානම් පිළිබඳ පුළුල් සමාලෝචනයක් සපයයි. යහපත් භාවිතාවන් පිළිබඳ නිර්දේශ සපයයි.

## ඇමුණුම A: RESPECT මූලෝපායන්ගේ බලපෑම සහ ප්‍රතිඵල සම්බන්ධ දර්ශක

RESPECT මූලෝපායන් එකිනෙක සතුව බලපෑම්, ප්‍රතිඵල සහ ප්‍රතිදාන ප්‍රකාශන කට්ටලයක් තිබේ. එම මූලෝපායන් හත හරහාම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය දුරලීම බලපෑමක් ලෙස දැක්වේ. 3 සහ 4 වගු විසින් පහත දැක්වෙන විස්තර ඉදිරිපත් කරනු ලැබේ. එක් එක් මූලෝපායන් විසින් ඉලක්ක කරනු ලබන බලපෑම් සහ ප්‍රතිඵල, මෙම ප්‍රතිඵල මැනීම සඳහා භාවිතා කළ හැකි සහ අනුරූප කරගත හැකි දර්ශක සඳහා නිදර්ශන, මෙම දර්ශක භාවිතා කිරීම සම්බන්ධ මාර්ගෝපදේශ සහ සම්පත්වල සාරාංශයක්. ප්‍රතිදාන (outputs) සම්බන්ධ දර්ශක ඇතුළත් කර නැත. ඒවා වැඩසටහනට සහ ක්‍රියාත්මක කිරීමේ සංදර්භයට අනුරූප කරගත හැකිය.

## වගුව 3: RESPECT මූලෝපාය බලපෑම, දර්ශක සහ මාර්ගෝපදේශ

සටහන: RESPECT රාමුව තුළ බලපෑම් ප්‍රතිඵල හතරක් තිබේ. ඒවාට විවිධ මූලෝපායන් දායක වේ. ඒවා 3 වගුවෙහි බලපෑම් 1 සිට 4 දක්වා ලේබල් කර තිබේ. ඒ හා අනුගත දර්ශක ද ඒ අනුව ලේබල් කර තිබේ (උදා: 1 බලපෑම සඳහා 1.1 සහ 1.2). එම දර්ශක නිශ්චිත RESPECT මූලෝපායට යෝග්‍ය වේ.

| මූලෝපාය | බලපෑම | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|
| **R**<br>**සම්බන්ධතා කුසලතා ශක්තිමත් කර ඇත** | 1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත | 1.1. කිසියම් කලක සහකාරියක වී තිබෙන වයස අවු: 15 සහ එයට වැඩි කාන්තාවන් සහ ගැහැණු ළමයින් වත්මන් හෝ හිටපු සමීප සහකරු වෙතින් පසුගිය මාස 12 තුළදී ශාරීරික, ලිංගික හෝ මානසික ප්‍රචණ්ඩත්වයට ගොදුරු වී තිබෙන අනුපාතය.<br>(තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.2.1) | මෙම දර්ශක තිරසර සංවර්ධන අරමුණු 5.2.1 සමග සම්බන්ධ වේ. ජනගහන මට්ටමේදී (උදා: භූගෝලීය ප්‍රදේශය) හෝ වැඩසටහන් මට්ටමේදී (උදා: ඍජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙනුවෙන්) මැනිය හැකිය. සමීප සහකරු ප්‍රචණ්ඩත්වය (IPV) යනු සුලබම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ස්වරූපයකි. දර්ශකය අනුව එයට වත්මන් හෝ හිටපු සහකරුවකු හෝ කලත්‍රයකු විසින් සිදුකරනු ලබන ශාරීරික, ලිංගික හෝ මානසික (චිත්තවේගී ලෙස ද හැඳින්වේ) ප්‍රචණ්ඩත්වය අයත් වේ. තිරසර සංවර්ධන අරමුණු දර්ශක මගින් පසුගිය මාස 12 ඇතුළතදී නවයොවුන් ගැහැණු ළමයින් සහ වයස අවුරුදු 15 - 49 අතර ප්‍රජනන වියේ කාන්තාවන් මුහුණදුන් ඕනෑම ආකාරයක IPV මනිනු ලැබේ. RESPECT දර්ශකවල ඉහළ වයස් සීමාව ඉවත් කර තිබේ. IPV අත්දැක තිබෙන වැඩිහිටි කාන්තාවන් ඇතුළත් කරගැනීම එහි අරමුණයි.<br><br>දර්ශකයේ මිනුම් ඉලක්කගත IPV ස්වරූපයට අනුරූප කළ යුතුය. ප්‍රචණ්ඩත්වයේ ස්වරූපය, වයස සහ වෙනත් අදාළ චරිත ලක්ෂණ අනුව දත්ත වෙන්කර වෙනම වර්ග කළ යුතුය. IPV මිනුම් බොහෝ විට ශාරීරික සහ ලිංගික IPV වෙත අවධානය යොමුකරයි. ශාරීරික ප්‍රචණ්ඩත්වය වෙත අවධානය යොමුකරන්නේ අඩුවෙනි. අඩුවෙන් මනිනු ලබන තවත් IPV ස්වරූපයක් වන්නේ ආර්ථික ප්‍රචණ්ඩත්වයයි. ඇතැම්විට එය මානසික IPV මිනුම් වෙත ඒකාබද්ධ කරනු ලැබේ. ඇතැම් විට වෙනම IPV ස්වරූපයක් ලෙස සැලකේ. මෑත සාක්ෂිවලින් හෙළිවන පරිදි චිත්තවේගී සහ ආර්ථික IPV සතුව කාන්තාවන්ට අදාළ කැපීපෙනෙන බලපෑම් තිබේ. ඒවා IPV ක්‍රියාමාර්ග සමග සම්බන්ධ කළ යුතුය.[26]<br><br>WHO MCS විසින් ශාරීරික සහ ලිංගික IPV මැනීම සඳහා ප්‍රශ්න මාලාවක් සැලසුම් කරන ලදී. ඒවා බහුවිධ පළාත් හා රාජ්‍යවල එලදායී ලෙස භාවිතා කර තිබේ. මෙම ප්‍රශ්න දකුණු අප්‍රිකාව විසින් ද අනුගත කරගෙන පුළුල්ව භාවිතා කර තිබේ.[27] උදාහරණයක් ලෙස What Works to Prevent Violence Against Women and Girls ගෝලීය වැඩසටහන සැලකිය හැකිය. චිත්තවේගී හා ආර්ථික IPV වෙනුවෙන් මූලාශ්‍ර රැසක් තිබේ. WHO MCS, DHS සහ UN MCS අංග එයට ඇතුළත් වේ. |

## අධීක්ෂණය සහ ඇගයීම

| මූලෝපාය | බලපෑම | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|
| | | 1.2. වයස අවු: 15 සහ එයට වැඩි කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමීප සහකරු නොවන වෙනත් අය වෙතින් පසුගිය මාස 12 තුළදී ලිංගික ප්‍රචණ්ඩත්වයට ගොදුරු වී තිබෙන අනුපාතය.<br>(තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.2.2) | මෙම දර්ශක තිරසර සංවර්ධන අරමුණු 5.2.2 සමග සම්බන්ධ වේ. එමගින් කිසිවකු මත පටවනු ලබන දූෂණය, ලිංගික අපයෝජනය, බලහත්කාර ලිංගික සම්බන්ධතා, ව්‍යභිචාරය හෝ ලිංගික පීඩා වැනි ඕනෑම ලිංගික ක්‍රියාකාරකමක් හෝ චර්යාවක් ලිංගික ප්‍රචණ්ඩත්වය ලෙස අර්ථ නිරූපණය කරනු ලැබේ. තිරසර සංවර්ධන අරමුණු දර්ශක විසින් පසුගිය මාස 12 ඇතුළතදී නවයොවුන් ගැහැණු ළමයින් සහ වයස අවුරුදු 15 - 49 අතර ප්‍රජනන වියේ කාන්තාවන් මුහුණදුන් සමීප සහකරු නොවන වෙනත් පුද්ගලයකු විසින් සිදුකරන ලද ඕනෑම ආකාරයක ලිංගික හිංසන මනිනු ලැබේ. ජනගහන මට්ටමේදී (උදා: භූගෝලීය ප්‍රදේශය) හෝ වැඩසටහන් මට්ටමේදී (උදා: ඍජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙනුවෙන්) මැනිය හැකිය. RESPECT දර්ශකවල ඉහළ වයස් සීමාව ඉවත් කර තිබේ. සමීප සහකරු නොවන වෙනත් පුද්ගලයකු විසින් සිදුකරන ලද ලිංගික හිංසනය අත්දැක තිබෙන වැඩිහිටි කාන්තාවන් ඇතුළත් කරගැනීම එහි අරමුණයි.<br><br>දර්ශකයේ මිනුම ඉලක්ක කරනු ලබන ලිංගික ප්‍රචණ්ඩත්වයේ ස්වරූපය අනුව අනුරූප කරගත යුතුය. වයස, සිදුවූ ස්ථානය හෝ වරදකරුගේ ස්වරූපය වැනි වෙනත් අදාළ ලක්ෂණ අනුව වෙනම ගණනය යුතුය. සමීප සහකරු නොවන වෙනත් අයෙකු විසින් සිදුකරන ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ දත්ත එක්රැස් කරන බොහෝ සමීක්ෂණ විසින් බලහත්කාර ලිංගික සංසර්ගය හෝ ඒ සඳහා උත්සාහ කිරීම හෝ වෙනත් ලිංගික ක්‍රියා පිළිබඳ මිනුම් ගනු ලැබේ.<br><br>සමීප සහකරු නොවන වෙනත් අයෙකු විසින් සිදුකරන ලිංගික ප්‍රචණ්ඩත්වය මැනීම උදෙසා භාවිතා කරන ප්‍රශ්න සඳහා උදාහරණ WHO MCS, DHS සහ VACS හි තිබේ. එවැනි ජනගහන සමීක්ෂණ මගින් සාම්පලය ලෙස සලකනු ලබන්නේ වයස අවුරුදු 15ට වැඩි ගැහැණු ළමයින් සහ කාන්තාවන්ය. VACS විසින් සාම්පලය ලෙස සලකන්නේ වයස අවුරුදු 13ට වැඩි ගැහැණු ළමයින්ය. |
| **E**<br>**කාන්තාවන් සවිබලගැන්වීම** | 1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත | බලන්න බලපෑම් දර්ශක 1.1 | 1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | බලන්න බලපෑම් දර්ශක 1.2 | 1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | 2. කාන්තාවෝ තම මානව හිමිකම් අභ්‍යාස කරමින් සංවර්ධනයට දායක වෙති | 2.1. ජාතික පාර්ලිමේන්තුවේ සහ පළාත් පාලන ආයතනවල කාන්තාවන් සතු ආසන සංඛ්‍යාව (තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.5.1) | මෙම බලපෑම් ප්‍රකාශය සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක 5.5 සමගය. එනම්, දේශපාලන, ආර්ථික සහ පොදු ජීවිතයේදී තීරණ ගැනීමේ මට්ටම්වල පූර්ණ හා ඵලදායී සහභාගීත්වය සහ සමාන නායකත්ව අවස්ථා සහතික කිරීමයි. තිරසර සංවර්ධන අරමුණු ඉලක්කවලට පහත දැක්වෙන දර්ශක ද අයත් වේ: 5.5.1(a), ජාතික පාර්ලිමේන්තුවල කාන්තාවන්ගේ ආසන අනුපාතය සහ 5.5.1(b) පළාත් පාලන ආයතනවල කාන්තාවන්ගේ ආසන අනුපාතය. පාර්ලිමේන්තුවෙන් ලබාගත් සංඛ්‍යාලේඛන, මැතිවරණ වාර්තා හෝ අමාත්‍යාංශවලින් ලබාගත හැකි රාජ්‍ය පරිපාලන දත්ත ද දත්ත මූලාශ්‍රවලට අයත් වේ. |
| | | 2.2. නීතිමය ව්‍යූහය (සම්ප්‍රදායික නීති ද ඇතුළත්ව) මගින් ඉඩම් සම්බන්ධ කාන්තාවන්ගේ සමාන අයිතිවාසිකම් සහ/ හෝ පාලනය තහවුරු කරන රටවල් අනුපාතය (තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.a.2) | මෙම බලපෑම් ප්‍රකාශය සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.a.2 සමගයි. එය ඉඩම් අයිතිය සහ/ හෝ පාලනය අවධාරණය කරයි. වෙනත් ආර්ථික මූලාශ්‍රවල පාලනය සහ කාන්තාවන්ගේ දිළිඳුකම අවම කිරීම සහ මානව හිමිකම් වෙත ප්‍රවේශය සමග සම්බන්ධය. මෙම දර්ශකය මනිනු හා අධීක්ෂණය කරනු ලබන්නේ නියෝජනයන් හයකට සාපේක්ෂවය. එය දර්ශක මාර්ගෝපදේශ හා මෙටාඩේටාවල මූලික අර්ථදැක්වීම හා මූලාශ්‍ර සමග දැක්වේ. මෙම නියෝජනයන් මගින් එක් එක් රට කාන්තාවන්ගේ ඉඩම් හිමිකමට සහාය දක්වන ආකාරය මැනිය හැකිය. |

## අධීක්ෂණය සහ ඇගයීම

| මූලෝපාය | බලපෑම | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|
| | | 2.3. ලිංගික සම්බන්ධතා, ප්‍රතිසන්ධිරෝධක භාවිතය සහ ප්‍රජනන සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ දැනුවත් ස්වාධීන තීරණ ගතහැකි වයස අවුරුදු 15-49 අතර කාන්තාවන් අනුපාතය.<br>(තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.6.1) | මෙම බලපෑම් දර්ශකය සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු දර්ශක 5.6.1 සමගයි. ක්ෂේත්‍ර තුනෙහිදීම කාන්තාවන්ගේ තීරණගැනීම මනියි. එනම්, ලිංගික සම්බන්ධතා (තම සැමියා/ සහකරු සමග ලිංගික සම්බන්ධතා පවත්වන්නට ඔවුන්ට අවශ්‍යද යන කාරණය), ප්‍රතිසන්ධිරෝධක භාවිතය සහ ප්‍රජනන සෞඛ්‍යාරක්ෂාවට ප්‍රවේශයයි. දර්ශක මාර්ගෝපදේශ හා මෙටාඩේටා විසින් දර්ශක මැනීම සඳහා භාවිතා කරන සමීක්ෂණ ප්‍රශ්න තුනක් සපයා තිබේ. ඒවා උපුටාගෙන තිබෙන්නේ DHS සහ MICS වෙතිනි. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). |
| | | 2.4. SIGI සුචිය | බලපෑම් දර්ශක 2.1, 2.2 සහ 2.3 කාන්තාවන් තම අයිතිවාසිකම් අභ්‍යාස කරන සහ සංවර්ධනයට දායක වන විවිධ මානයන් මනියි. කාන්තා අයිතිවාසිකම්වල බහුවිධ මානයන් ඒකාබද්ධ කරන සමාජභාවී දර්ශක රැසක් තිබේ. ඒවායින් සමහරක් Data2X, Mapping Gender Data Gaps (බලන්න පිටුව 42) ලේඛනයෙහි තිබේග OECD සංවර්ධන මධ්‍යස්ථානයෙහි සමාජ ආයතන සහ සමාජභාවී දර්ශකය - Social Institutions and Gender Index (SIGI) විසින් සමාජ ආයතනවලදී කාන්තාවන්ට වෙනස්කම් කිරීම මනිනු ලැබේ. එමගින් සංවර්ධනයට දායක වීම සඳහා කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ හැකියාවන් සීමා කරනු ලැබේ. කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ විශේෂිත මානයන් වැඩසටහන් විසින් තෝරාග නු ඇත. ඒ සඳහා විකල්පයන් SIGI වෙතින් ලබාගත හැකිය.<br><br>SIGI විසින් වර්තමානයේදී රටවල් 180ක් සම්බන්ධ මිනුම් කරනු ලැබේ. වෙනස්කොට සැලකීම් කරන සමාජ ආයතනවල මානයන් හතරක් ආවරණය කරනු ලැබේ.<br>» පවුලේ වෙනස්කම් කිරීම් - ළමා විවාහ, කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ පවුල් වගකීම්, දික්කසාදය ලබාගැනීමේ හැකියාව සහ උරුම අයිතිවාසිකම් ලබාගැනීමේ හැකියාව එයට අයත් වේ.<br>» ශාරීරික ඒකාග්‍රභාවය සීමාකිරීම - කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැවතීම සහ ප්‍රචණ්ඩත්වයෙන් නීතිමය ආරක්ෂණයන්, කාන්තා ලිංගේන්ද්‍රිය විකෘති කිරීම (FGM) සහ කාන්තාවන්ගේ ප්‍රජනන ස්වාධිපත්‍යය එයට අයත් වේ.<br>» ඵලදායී සහ මූල්‍ය සම්පත්වලට ප්‍රවේශය සීමාකිරීම - ඉඩම් වත්කම්වලට, ඉඩම් නොවන වත්කම්වලට සහ නිල මූල්‍ය සේවාවන්ට ප්‍රවේශය සුරක්ෂා කිරීම, සේවා ස්ථාන අයිතිවාසිකම්වලට ප්‍රවේශය මෙයට අයත් වේ.<br>» සිවිල් නිදහස සීමාකිරීම - පුරවැසි අයිතිවාසිකම්, දේශපාලන හඬ, සංචලනයේ නිදහස සහ යුක්තිය වෙත ප්‍රවේශය මෙයට අයත් වේ. |
| **S**<br>**සේවා සහතික කර ඇත** | 1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත | බලන්න බලපෑම් දර්ශක 1.1 | 1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | බලන්න බලපෑම් දර්ශක 1.2 | 1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |

| මූලෝපාය | බලපෑම | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|
| | 3. නිවාසවල ප්‍රජාවේ සහ සමාජයේ වැඩිදියුණු කරන ලද සෞඛ්‍යය සහ සංවර්ධන ප්‍රතිඵල | 3.1. ශාරීරික, මානසික සහ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පැත්තෙන් ඉලක්ක කරන ලද කාන්තාවන් සහ පිරිමින් අනුපාතය | වැඩසටහන මගින් ඉලක්ක කරන ලද සේවා මත රඳාපවතිමින් සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අඩුකිරීමට සහ බේරුණු පුද්ගලයන්ගේ හදිසි සෞඛ්‍ය අවශ්‍යතාවලට අනුව කිසියම් වැඩසටහන් මැදිහත්වීමක් පුළුල් සෞඛ්‍ය ප්‍රතිඵල වර්ධනය කිරීමට අරමුණු කරන්නේද යන්න සැලකිල්ලට ගනිමින් මෙම බලපෑම සම්බන්ධ දර්ශක වඩා නිශ්චිත කිරීම අවශ්‍යය. ආදර්ශ දර්ශකවලට පහත දැක්වෙන කාරණා ඇතුළත්ය:<br>» බෝවෙන සහ බෝ නොවන රෝග සහිත ගැහැණුන් හා පිරිමින් අනුපාතය<br>» හානිකර මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතා කරන බව කියන ගැහැණුන් හා පිරිමින් අනුපාතය<br>» පසුගිය මාසයේදී විෂාධ ලක්ෂණ පෙන්වූ ගැහැණුන් හා පිරිමින් අනුපාතය<br>» චිත්තවේගී යහපැවැත්ම වාර්තා කළ ගැහැණුන් හා පිරිමින් අනුපාතය<br>» පුහුණු වෘත්තික සහාය සහිතව පසුගිය මාස 12 තුළදී දරුවකු ප්‍රසූත කළ ගැහැණුන් අනුපාතය<br>» ආසන්නම දරු උපත මෙම කාලය තුළදී සිදුකිරීමට අවශ්‍ය වූ ගැහැණුන් අනුපාතය |
| | | 3.2. පොලිසියට වාර්තා වූ, විමර්ශනය කරන ලද හා නඩු පවරන ලද කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නඩු අනුපාතය | කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදුවීම්වලට ප්‍රතිචාර දක්වන සක්‍රිය, කාර්යක්ෂම පොලිසියක් හා නීති පද්ධතියක් පැවතීම සම්බන්ධ ප්‍රධාන මිනුම වන්නේ පොලිසිය විසින් විමර්ශනය කර නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලද නඩු සංඛ්‍යාවයි. පොලිස් හා අධිකරණ වාර්තා මගින් දර්ශකය මැනිය හැකිය. වැඩිදුර මාර්ගෝපදේශ මෙතනින්: UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls සහ Violence Against Women and Girls: A Compendium of Monitoring and Evaluation Indicators. |
| **P**<br>**දිළිඳුභාවය අවම කර ඇත** | 1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත | බලන්න බලපෑම් දර්ශක 1.1 | 1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | බලන්න බලපෑම් දර්ශක 1.2 | 1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | 3. නිවාසවල, ප්‍රජාවේ සහ සමාජයේ වැඩිදියුණු කරන ලද සෞඛ්‍යය සහ සංවර්ධන ප්‍රතිඵල | 3.3. ශාරීරික, මානසික සහ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය ප්‍රතිඵල වර්ධනය කරගෙන තිබෙන ගැහැණුන් හා පිරිමින් අනුපාතය | 3.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | 3.4. ලිංගිකභාවය සහ වයස අනුව, ජාතික දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන ජනගහනයේ අනුපාතය (තිරසර සංවර්ධන අරමුණු දර්ශක 1.2.1) | මෙම බලපෑම් දර්ශකය සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු දර්ශක 1.1 සමගයි. එමගින් මනිනු ලබන්නේ ජාතික දරිද්‍රතා අනුපාතිකය සහ ජාතික දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන ජනගහනයේ අනුපාතයයි. ආදායම වෙනුවට ගෘහ පාරිභෝජනය මගින් දරිද්‍රතාව මනින ලෙස මාර්ගෝපදේශ සහ මෙටාඩේටා දර්ශක නිර්දේශ කරයි. සවිස්තර මාර්ගෝපදේශ අර්ථ නිරූපණ සහ දත්ත මූලාශ්‍ර එමගින් සපයනු ලැබේ. |
| | | 3.5. ජාතික අර්ථ නිරූපණානුකූල සෑම මානයකටම අනුව සෑම වයසකම පිරිමින් ගැහැණුන් හා ළමයින් අනුපාතය (තිරසර සංවර්ධන අරමුණු දර්ශක 1.2.2) | මෙම බලපෑම් දර්ශකය සම්බන්ධ වන්නේ 1.2.2 තිරසර සංවර්ධන අරමුණු දර්ශකය සමගය. මෙම තිරසර සංවර්ධන අරමුණු දර්ශකය වෙනුවෙන් විශේෂිත මාර්ගෝපදේශ හෝ මෙටාඩේටා තවම ප්‍රසිද්ධ කර නැත. කෙසේ වෙතත් ඇතැම් මූලාශ්‍ර උකහාගෙන තිබෙන්නේ බහුපාර්ශ්වීය දරිද්‍රතා දර්ශකයෙනි. එමගින් දුර්වල සෞඛ්‍යය, අධ්‍යාපනයේ අඩුව, ජීවන ප්‍රමිතියේ අප්‍රමාණවත්බව, ආදායම් අප්‍රමාණවත්කම, බලය නොමැතිකම, වැඩවල දුර්වල ගුණාත්මකබව සහ ප්‍රචණ්ඩත්වයේ තර්ජනය අනුව සිදුවන දුෂ්කරතාව එමගින් |

| මූලෝපාය | බලපෑම | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|
| | | 3.6. සමාජභාවී සමානාත්මතාව සහ ගෞරවනීය සම්බන්ධකම් සමීප සහකරු/ කාරිය සමග පවත්වන සෑම වයසකම පිරිමින් සහ ගැහැණුන් අනුපාතය | වැඩසටහන අනුව, මෙම බලපෑම් ප්‍රකාශනය සඳහා වන දර්ශක වඩා නිශ්චිත විය යුතුය. සමීප සම්බන්ධතාවලදී සමාජභාවී සමානාත්මතාව ප්‍රදර්ශනය කිරීමට ඒකාබද්ධ තීරණ ගැනීම සහ සමාජභාවී වශයෙන් වඩා සාධාරණ අන්දමින් ගෘහස්ථ භූමිකාවන් බෙදීයාම අවශ්‍යය. ගෞරවනීය සම්බන්ධතා ප්‍රදර්ශනය කිරීම තුළට වටිනාකම්, සම්මානනය සහ අනුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ සැලකිල්ල ඇතුළත්ය. ප්‍රතිචාර දැක්වූවකු කරන ප්‍රකාශය සහ ඔවුන්ට සෙසු අය සලකන/ අගයන ආකාරය පිළිබඳ ඔවුන්ට හැඟෙන ආකාරය යන දෙකම එහිදී අදාළය. |
| **E**<br>**පරිසරය සුරක්ෂා වීම** | 1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත | බලන්න බලපෑම් දර්ශක 1.1 | 1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | බලන්න බලපෑම් දර්ශක 1.2 | 1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | 1.3. ලිංගිකත්වය, වයස, ආබාධිත තත්වය සහ සිදුවන ස්ථානය අනුව පසුගිය මාස 12 තුළදී ශාරීරික හෝ ලිංගික හිංසනයේ වින්දිතයන් බවට පත්වූ අනුපාතය | මෙම දර්ශක සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු 11.7.2 සමගය. එමගින් ලිංගික හිංසනය ඕනෑම ලිංගික අර්ථයක් ඇති ක්‍රියාවක් ලෙස අර්ථ නිරූපණය කරයි. පුද්ගලයකුගේ ශාරීරික ඒකාග්‍රතාවට සහ/ හෝ චිත්තවේගී ස්වභාවයට පටහැණි බියක් නිර්මාණය කරන හිංසනය ඇතුළු සියලු ශාරීරික හිංසාවන් එයට ඇතුළත් වේ. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). ලිංගිකත්වය, වයස, ආබාධිත තත්වය සහ සිදුවන ස්ථානය අනුව මෙම දර්ශකය වෙන්කර දක්වනු ලැබේ. 11.7.2 තිරසර සංවර්ධන අරමුණ වෙනුවෙන් මාර්ගෝපදේශයට මෙම දර්ශකය මනින ක්‍රම ඇතුළත් වේ. ඒ අනුව, ගෘහස්ථ සමීක්ෂණයට ප්‍රශ්න අට ඇතුළත් කළ යුතුය. |
| | 4. ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ මුලිනුපුටා දමා ඇත | 4.1. වයස අවුරුදු 18 වන විට ලිංගික ප්‍රචණ්ඩත්වයට මුහුණ දුන් වයස අවුරුදු 18-29 අතර තරුණ කාන්තාවන්ගේ හා පිරිමින්ගේ අනුපාතය (තිරසර සංවර්ධන අරමුණු 16.2.3) | මෙම දර්ශක සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු 16.2.3 සමගය. වයස අවුරුදු 18 වන විට ලිංගික ප්‍රචණ්ඩත්වය යනු වයස අවුරුදු 17 හෝ ඊට අඩු ළමයකුට සිදුකරන ලිංගික ක්‍රියාවක් ලෙස එමගින් අර්ථ දක්වයි. ලිංගික අපයෝජනය, ලිංගික බලහත්කාරය, වානිජ ලිංගික සූරාකෑම (කුට්ටනය ඇතුළු), ළමා ලිංගික සේවා සහ ලිංගික සූරාකෑම හෝ වහල්භාවයට පත්කිරීම එයට ඇතුළත් වේ. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්).<br>වයස අවුරුදු 18-42 අතර කාන්තාවන් සහ පිරිමින් වෙනුවෙන් මෙම දර්ශකය විසින් මිනුම් ගනු ලැබේ. ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ මිනුම්වලට ප්‍රචණ්ඩත්වයේ වර්ගය සහ වැරදිකරු ඇතුළත් විය යුතුය. ඇතැම් අධීක්ෂණය හා ඇගයීම මෙවලම්වලට ප්‍රචණ්ඩත්වය සිදුවන වයස සහ ස්ථානය ද ඇතුළත් වේ.<br>ළමා වියේදී මුහුණදෙන ලිංගික ප්‍රචණ්ඩත්වය, අපයෝජනය සහ සූරාකෑම පරිසමාප්ත ප්‍රශ්න කට්ටලයක් VACS හි අඩංගු වේ. විවිධ වර්ගවල ලිංගික ප්‍රචණ්ඩත්වය, ප්‍රචණ්ත්වය සම්බන්ධ වැරදි සිදුකිරීම, ප්‍රතිචාර දක්වන්නා ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් වයස සහ වැරදිකරුවාගේ වයස සම්බන්ධ මිනුම් එයට ඇතුළත් වේ. |
| | | 4.2. සත්කාර සපයන්නන් වෙතින් පසුගිය මාසය තුළ කිසියම් ශාරීරික දඬුවමක් සහ/ හෝ මානසික හිංසනයක් වයස අවුරුදු 1 - 17 අතර ගැහැණු ළමයින්ගේ හා පිරිමි ළමයින්ගේ අනුපාතය (තිරසර සංවර්ධන අරමුණු 16.2.1) | මෙම බලපෑම් දර්ශකය සම්බන්ධ වන්නේ තිරසර සංවර්ධන අරමුණු 16.2.1 සහ INSPIRE: Seven strategies for ending violence against children සමගය. ශාරීරික දඬුවම් අතරට අල්ලා සෙලවීම, කම්මුලට පහරදීම, ගුටිබැට දීම සහ වාචික හිංසනය, කෑගැසීම, බැණවැදීම හෝ නම් පටබැඳී වැනි මානසික ආක්‍රමණික ක්‍රියා අයත් වේ. මෙම දර්ශකය මගින් පසුගිය මාසය තුළදී වයස අවුරුදු 1-17 අතර ළමයින් සහ නවයොවුන් පුද්ගලයන් විසින් මුහුණදුන් දඬුවම් හෝ ආක්‍රමණික ක්‍රියා මනිනු ලැබේ. එය ලිංගිකත්වය, වයස සහ ප්‍රචණ්ඩත්වයේ ස්වරූපය අනුව වෙන්කර දැක්විය යුතුය. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්).<br>රැකබලාගන්නන් විසින් සිදුකරනු ලබන ශාරීරික හා චිත්තවේගී ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් ළමයින් හා නව යොවුන් පුද්ගලයන්ට අදාළ ප්‍රශ්න කට්ටලයක් VACS හි අඩංගු වේ. බොහෝ අධ්‍යයනයන් විසින් ඒ වෙනුවට මව්පියන්/ රැකබලාගන්නන් විසින් ශාරීරික දඬුවම් සහ මානසික ආක්‍රමණශීලීත්වය භාවිතා කිරීම පිළිබඳ වාර්තා මනිනු ලැබේ. උදාහරණයක් ලෙස, MICS Child Discipline Moduleහි වයස අවුරුදු පහට අඩු හා 5-17 අතර ළමුන් සඳහා වෙන වෙනම මිනුම් අඩංගු වේ. මෙම දර්ශකය පිළිබඳ තවත් මාර්ගෝපදේශ පහත දැක්වෙන ලේඛනවල අඩංගු වේ: INSPIRE Indicator Guidance and Results Framework සහ 16.2.1 දර්ශකය සඳහා තිරසර සංවර්ධන අරමුණු මාර්ගෝපදේශ. |

| මූලෝපාය | බලපෑම | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|
| **C** **ළමා සහ නවයොවුන් අපයෝජන වැළැක්වීම** | 1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත | බලන්න බලපෑම් දර්ශක 1.1 | 1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | බලන්න බලපෑම් දර්ශක 1.2 | 1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | 4. ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත | බලන්න බලපෑම් දර්ශක 4.1 | 4.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | බලන්න බලපෑම් දර්ශක 4.2 | 4.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| **T** **ආකල්ප, විශ්වාසයන් සහ සම්මතයන් පරිවර්තනය කර ඇත** | 1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත | බලන්න බලපෑම් දර්ශක 1.1 | 1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | බලන්න බලපෑම් දර්ශක 1.2 | 1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |

## වගුව 4: RESPECT මූලෝපාය ප්‍රතිඵල, දර්ශක සහ මාර්ගෝපදේශ

සටහන: 4 වගුවෙහි R මූලෝපාය යටතෙහි වන ප්‍රතිඵල ප්‍රකාශනය R1, R2, R3 ලෙස ලේබල් කර තිබේ. ඒ සමග අනුකූල ලෙස දර්ශක ද ලේබල් කර තිබේ. උදා: R1 ප්‍රතිඵලය වෙනුවෙන් R1.1, R1.2 සහ R1.3. සෙසු ප්‍රතිඵල ප්‍රකාශන වෙනුවෙන් ද ඉක්මණින් එසේ කරනු ඇත. යොමුකිරීමේ පහසුව සඳහා මූලෝපාය හරහා මෙම ලේබල්කරණය නැවත නැවත භාවිතා කර තිබේ.

| මූලෝපාය | බලපෑම | ප්‍රතිඵල | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|---|
| **R** **සම්බන්ධතා කුසලතා ශක්තිමත් කිරීම** | කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත | R1. සමාජභාවී සමානාත්මතාව සහ ගරුත්වය සමීප හා පවුල් සම්බන්ධතාවලදී භාවිතා කරනු ලැබේ. | R1.1. වයස අවුරුදු 15-49 අතර වර්මානයේදී සහකරුවකු සිටින කාන්තාවන් සහ ගැහැණු ළමයින් අතර (තනිව හෝ සාමූහිකව) පවුලේ තීරණ ගැනීමට සහභාගී වන අනුපාතය | මෙම ප්‍රතිඵල දර්ශකය INSPIRE හි 7.3 දර්ශකය සමග සම්බන්ධ වේ. එහෙත්, එය මිනුම් ස්වරූපයෙන් මඳක් වෙනස් වේ. INSPIRE විසින් තමන්ගේම සෞඛ්‍යය, නිවසේ වැදගත් මිලදීගැනීම් සිදුකිරීම හෝ පවුලේ මිතුරන් බලන්නට යාම සම්බන්ධ පවුලේ තීරණ ගැනීම සඳහා (තනිව හෝ සැමියා සමග සාමූහිකව) සහභාගී වීම කාන්තා සහභාගීත්වය ලෙස අර්ථකථනය කරනු ලැබේ. මෙහිදී, තීරණ ගැනීමෙහිලා කාන්තාවන් සහ ගැහැණු ළමයින් සහභාගී වීම (තනිව හෝ සැමියා සමග සාමූහිකව) මනිනු ලබන්නේ පවුලට සම්බන්ධ තීරණ වෙනුවෙන් පමණි. උදාහරණයක් ලෙස පවුල වෙනුවෙන් මිලදීගැනීම් සහ පවුලේ ආදායම වියදම් කිරීම එයට ඇතුළත් වේ. කාන්තාවන් තම ස්වාධීන ක්‍රියාවන් සම්බන්ධයෙන් තීරණ ගන්නා අනෙකුත් තීරණ ගැනීම් වර්ග සවිබලගැන්වීමේ මූලෝපාය යටතේ කාන්තාවන් සහ ගැහැණු ළමයින්ට ස්වාධීන තීරණ ගත හැකිය ප්‍රතිඵලය මගින් ග්‍රහණය කරගෙන තිබේ.<br><br>දර්ශකය මැනීම DHS වෙතින් අනුරූප කරගත හැකිය. පවුලේ ප්‍රශ්න රැසක් සම්බන්ධයෙන් කාන්තාවන්ගේ තීරණ ගැනීම මනින ප්‍රශ්න මාලාවක් එහි අඩංගු වේ. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). |

## අධීක්ෂණය සහ ඇගයීම

| මූලෝපාය | බලපෑම | ප්‍රතිඵල | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|---|
| | | | R1.2. සමාජභාවී වශයෙන් සමාන අන්දමින් ගෘහ කටයුතුවල වගකීම බෙදාග න්නා බව වාර්තා කරන ගැහැණුන් හා පිරිමින් අනුපාතය | සමාජභාවී සමාන අන්දමින් පවුලේ භූමිකාවන් බෙදාගැනීම අර්ථ නිරූපණය කර තිබෙන්නේ ගෙදරදොර කටයුතුවලදී කාන්තාවන්ගේ හා පිරිමින්ගේ සහභාගීත්වය ලෙසයි. දරුවන් බලාගැනීම, ගෙදරදොර කටයුතු සහ වෙනත් පවුල් ගෘහ කටයුතු එයට අයත් වේ. උදාහරණයක් ලෙස, IMAGES සමීක්ෂණය තුළ පවුලේ ශ්‍රම විභජනය හා රැකබලාගැනීමේ කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ප්‍රශ්න අඩංගු වේ. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: ඍජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). |
| | | | R1.3. පසුගිය මාස 12 තුළදී සමීප සහකරුවකු වෙතින් පාලනය කරන චර්යාවකට මුහුණදුන් වයස අවු: 15 සහ එයට වැඩි ගැහැණුන් අනුපාතය | සමීප සහකරුවකුගේ පාලන චර්යාවන් වඩා දැඩි සමීප සහකරු ප්‍රචණ්ඩත්වයකට හේතු විය හැකි කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ස්වරූපයක් ලෙස පුළුල්ව හඳුනාගෙන තිබේ.සංචලනය සීමා කිරීම, යහළුවන් හෝ පවුල ඇසුරු කිරීම සීමාකිරීම සහ ඊර්ෂ්‍යාව හෝ අවිශ්වාසය ප්‍රකාශ කිරීම පාලන චර්යාවන් තුළ තිබිය හැකිය.<br><br>කලත්‍රයකුගේ පාලන චර්යාවන්ට අදාළව වෛවාහක පාලනය මොඩියුලය හරහා යෝජිත DHS ක්‍රියාමාර්ගවලට පහත දැක්වෙන ආකාරයේ පාලනයන් සම්බන්ධ සමීක්ෂණ අයිතමයන් අයත් වේ.<br><br>» ඇය වෙනත් පිරිමියකු සමග කතා කළහොත් ඊර්ෂ්‍යාව හෝ කෝපය<br>» විශ්වාසය කඩකිරීම පිළිබඳ ඇයට නිරතුරු චෝදනා කිරීම<br>» ඇයට ඇගේ මිතුරියන් හමුවීමට නොදීම<br>» ඇයට ඇගේ පවුල සමග සම්බන්ධතා පැවැත්වීමට ඉඩ නොදීම<br>» හැම විටම ඇය සිටින්නේ කොහිදැයි දැනගැනීමට අවශ්‍ය වීම<br>» මුදල් සම්බන්ධයෙන් ඇය විශ්වාස නොකිරීම<br><br>මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: ඍජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). |
| | | R2. පුද්ගලාන්තර ගැටුම් සාමකාමී ලෙස විසඳාගනු ලැබේ. | R2.1. තම ආසන්නම නොඑකඟතා තුන ප්‍රචණ්ඩ නොවන ආකාරයෙන් විසඳාගත් බව ප්‍රකාශ කරන සෑම වයසකම පිරිමින් සහ ගැහැණුන් අනුපාතය | අහිංසාවාදී ගැටුම් විසඳීමේ මාර්ග තුළට ශාරීරික සහ චිත්තවේගී ප්‍රචණ්ඩත්වය ප්‍රතික්ෂේප කිරීම සහ ධනාත්මක සන්නිවේදනය ඇතුළත් කරගැනීම ද අයත් වේ. එයට සාමකාමී සංවාදය, සහකම්පනය, සවන්දීම, කෝපය කළමනාකරනය කිරීම, සාකච්ඡාව, මැදිහත්වීම සහ සංහිඳියාව අයත් වේ.<br><br>යුවල අතර අහිංසාවාදී ගැටුම් විසඳීම මිනිය හැකි අඩු හා මැදි ආදායම් රටවල භාවිතා කළ හැකි මෙවලම් පරාසයක්ම තිබේ. ගැටුම් උපාය පරිමාණ, යුවල ක්‍රියාත්මකභාවයේ තක්සේරු මෙවලමෙහි සන්නිවේදන උප පරිමාණල සන්නිවේදන රටා ප්‍රශ්නාවලියෙහි ධනාත්මක සන්නිවේදන උප පරිමාණය සහ පොදු සන්නිවේදන සහ ගැටුම් විසඳුම් පරිමාණයෙහි අන්‍යෝන්‍ය වශයෙන් ධනාත්මක සන්නිවේදනයට දායක වීම ඒ අතර වේ. |

## අධීක්ෂණය සහ ඇගයීම

| මූලෝපාය | බලපෑම | ප්‍රතිඵල | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|---|
| | | R3. යුවල සහ පවුල් සමාජභාවී සමානාත්මතාව සමාජ සම්මතයක් ලෙස විශ්වාස කරති. ඔවුහු තවදුරටත් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිනොගනිති. | R3.1. ස්වාමියකු (පුරුෂයකු) තම බිරිඳට (සහකාරියට) එක් අවස්ථාවකදී හෝ පහරදීම සාධාරණීකරනය කරන ජනයාගේ අනුපාතය ලිංගිකභාවය හා වයස අනුව වෙන් වෙන්ව | ප්‍රචණ්ඩත්වය ගැටුම් විසඳීමෙහි, කාන්තාවන් විනයගත කිරීමෙහි හෝ ගෞරවයට වූ හානිය නැති කරගැනීමෙහි යුක්ති සහගත ක්‍රමයක් ලෙස මිනිසුන් පිළිගන්නා විට කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය භාරගන්නා හෝ සාධාරණීකරණය කරන ආකල්ප ඇතිවිය හැකිය. මෙම මූලෝපායේදී 'මිනිසුන්' යන්නෙන් සහකරුවන්/ සහකාරියන් සහ වෙනත් පවුල් සාමාජිකයන් අදහස් කරනු ලැබේ.<br><br>මෙම දර්ශකය ජනගහන අධ්‍යයනවලදී භාවිතා කරනු ලබන WHO MCS සහ DHS වැනි සුලබ එකකි. එහි සාමාන්‍යයෙන් අවස්ථා පහක් ඉදිරිපත් කරනු ලැබේ. කාන්තාවක් තම සැමියාට නොපවසා නිවසින් බැහැරව යන්නේ නම්, ඇය ළමයින් නොතකාහරින්නේ නම්, ඇය තම සැමියා සමග වාද කරන්නේ නම්, ඇය සැමියා සමග ලිංගික ක්‍රියා ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ ඇය ආහාර පුළුස්සන්නේ නම් වශයෙනි. ඇතැම් අධ්‍යයන විසින් වෙනත් අවස්ථා ද අධ්‍යයනය කරනු ලැබේ. ඒ කාන්තාවක් ඇගේ සැමියාට හෝ සහකරුට අකීකරු වන්නේ නම් හෝ හිතෛෂී නොවන්නේ නම් ආදී වශයෙනි.<br><br>මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී). නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). |
| | | | R3.2. සමාජභාවී වශයෙන් සමානාත්මතා අදහස් දරන ජනයාගේ අනුපාතය | කාන්තාවන්ගේ හා පිරිමින්ගේ අයිතිවාසිකම්, භූමිකාවන් සහ වගකීම් පිළිබඳ සාධාරණත්වය හා සමානාත්මතාව පිළිබඳ ආකල්ප සමාජභාවී වශයෙන් සාධාරණ ආකල්ප ලෙස සැලකේ. මෙම මූලෝපායේදී 'මිනිසුන්' යන්නෙන් සහකරුවන්/ සහකාරියන් සහ වෙනත් පවුල් සාමාජිකයන් අදහස් කරනු ලැබේ.<br><br>සමාජභාවී වශයෙන් සාධාරණ මිනිසුන් (GEM) සම්බන්ධ පරිමාණය සමාජභාවී සාධාරණත්වය පිළිබඳ ආකල්ප මැනීම සඳහා ප්‍රයෝජනවත් මෙවලමකි. එය බහුවිධ රටවල සංදර්භයන් තුළ පිරිමින්ගේ හා කාන්තාවන්ගේ භූමිකාවන් සහ වගකීම් පිළිබඳ දැක්ම මැනීම සඳහා භාවිතා කර තිබේ. |
| **E**<br>**කාන්තාවන් සවිබලගැන්වීම** | කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත<br><br>කාන්තාවෝ තම මානව හිමිකම් අභ්‍යාස කරමින් සංවර්ධනයට දායක වෙති | E1. සමීප, පවුල් හා ප්‍රජා සම්බන්ධතාවලදී සමාජභාවී සමානාත්මතාව සහ ගරුත්වය භාවිතා කරනු ලැබේ. | E1.1. පවුලේ තීරණ ගැනීමේදී (තනිව හෝ ඒකාබද්ධව) සහභාගී වන, වර්තමානයේදී සහකරුවන් සිටින වයස අවුරුදු 15-49 අතර කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ අනුපාතය | R1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | | E1.2. සමාජභාවී වශයෙන් සාධාරණ අන්දමින් පවුලේ කටයුතු බෙදාගන්නා භාවිතයක් ඇති බව වාර්තා කරන ගැහැණුන් හා පිරිමින් අනුපාතය | R1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |

## අධීක්ෂණය සහ ඇගයීම

| මූලෝපාය | බලපෑම | ප්‍රතිඵල | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|---|
| | | E2. කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට ස්වාධීන තීරණ ගත හැකිය. | E2.1. තමන්ගේ ජීවිත පිළිබඳ ස්වාධීන තීරණ ගත හැකි ගැහැණුන් සහ ගැහැණු ළමයින් අනුපාතය වයස අනුව වෙන්කර | ස්වාධීන තීරණ ගැනීම කාන්තාවන්ගේ නියෝජනයේ කොටසක් ලෙස සැලකේ. කාන්තාවන් සෞඛ්‍යාරක්ෂාව වෙත පිවිසීම, ප්‍රතිසන්ධිරෝධක භාවිතය සහ සංචලනය (පවුලේ අය සහ මිතුරියන් බලන්නට යාම) තම පෞද්ගලික ක්‍රියාකාරකම්වල තීරණ ගැනීම ද එයට අයත් වේ. ඒවා පවුලේ තීරණ ගැනීමෙන් වෙනස් වේ.<br>පවුලේ තීරණගැනීම සම්බන්ධ DHS ප්‍රශ්න (බලන්න: සම්බන්ධිතා මූලෝපාය යටතේ පවුලේ තීරණගැනීම සම්බන්ධ කාන්තාවන්ගේ සහභාගීත්වයේ වැඩිවීම පිළිබඳ ප්‍රතිඵල සඳහා මාර්ගෝපදේශ) සමග අනුරූප වීමෙන් මෙම දර්ශකය මැනිය හැකිය. අමතර ක්‍රියාමාර්ග ද භාවිතා කළ හැකිය. උදාහරණයක් ලෙස, කාන්තාවන් තම සංචලනය සම්බන්ධයෙන් ස්වාධීන තීරණ ගැනීම (උදා: ඔබගේ ගමේ වෙසෙන මිතුරියක/ පවුලේ සාමාජිකයකු බැලීමට පයින් හෝ පොදු ප්‍රවාහනයේ යාම සඳහා ඔබට අවසර තිබේද?) සැලකිය හැකිය. |
| | | | E2.2. නියෝජනයක් (agency) තිබෙන බව වාර්තා කරන ගැහැණුන් සහ ගැහැණු ළමයින් අනුපාතය | කාන්තාවන් සවිබලගැන්වීම සම්බන්ධ මෑතකාලීන කටයුතු මගින් යෝජනා කරන පරිදි තීරණ ගැනීම යනු කාන්තාවන්ගේ නියෝජනයේ අසම්පූර්ණ මිනුමකි. එම නියෝජනය ඍජුව මැනිය හැකිය. නියෝජනය යනු, ජීවිත අරමුණු සහ අභිමතාර්ථ අර්ථ නිරූපණය කිරීමට සහ ඒ අනුව කටයුතු කිරීමට කාන්තාවන්ට තිබෙන හැකියාව ලෙස අර්ථකථනය කළ හැකිය.28 කාන්තාවන්ගේ නියෝජනය මැනීම තුළ, අරමුණු සකසාගැනීම, හැකියාව සහ පාලනය පිළිබඳ දැක්ම (ඇතැම් විට ස්වයං හැකියාව ලෙස හඳුන්වනු ලැබේ), අරමුණු අනුව කටයුතු කිරීම ඇතුළු විවිධ මානයන් අඩංගු විය හැකිය.[28] මෙම මානයන් මැනීම සඳහා භාවිතා කරනු ලබන මෙවලම් සඳහා උදාහරණ ලෝක බැංකුව විසින් සම්පාදනය කරන ලද 'Measuring Women's Agency' මාර්ගෝපදේශයෙහි අඩංගු වේ. |
| | | E3. කාන්තාවන්ගේ මූල්‍ය ස්වාධීනතාව වර්ධනය කරගෙන තිබේ. | E3.1. මූල්‍ය ස්වාධීනත්වය වර්ධනය කරගන්නා ලද බව වාර්තා කරන ගැහැණුන් අනුපාතය | ආදායම් සහ ආර්ථික සම්පත් වෙත කාන්තාවන්ගේ ප්‍රවේශය සවිබලගැන්වීම සම්බන්ධ වැදගත් මිනුමකි. එහෙත්, තමන් උපයන ආදායම හෝ අත්පත් කරගන්නා සම්පත් සහ ආර්ථික ක්‍රියාකාරකම් සහ සම්පත්වලින් වාසි ලබාගැනීමේ බලය කාන්තාවන් විසින්ම පාලනය නොකරන නිසා එය ප්‍රමාණවත් නැත. ආර්ථික සම්පත් අතරට කුසලතා (උදා: වෘත්තීය පුහුණුව), මූල්‍ය ප්‍රාග්ධනය (උදා: මෙවලම්, ඉඩම්) අයත් වේ. ආර්ථික ක්‍රියාකාරකම් සහ සම්පත්වලින් වාසි ලබාගැනීමේ බලය මගින් අදහස් කරනු ලබන්නේ කාන්තාවන්ට තීරණ ගැනීමේ සහ මූල්‍ය ප්‍රාග්ධනය භාවිතා කරන හා වැයකරන ආකාරය ගැන තීරණගැනීමේ හැකියාව තිබෙන බවයි. කාන්තාවන්ගේ මූල්‍ය ස්වාධීනත්වය සහ ආර්ථික සවිබලගැන්වීම මනිනු ලබන ප්‍රශ්න සහ දර්ශක සංවර්ධනය කරගැනීම පිළිබඳ වැඩිදුර මාර්ගෝපදේශ ICRW, Oxfam විසින් සම්පාදනය කරන ලද මාර්ගෝපදේශවල සහ මෙම මාර්ග සිතියමෙහි තිබේ. |
| | | E4. කාන්තාවෝ පොදු සහ දේශපාලන ජීවිතයට සම්බන්ධ වෙති. | E4.1. පසුගිය මාස හය තුළදී මහජන රැස්වීමක් ඇමතූ ගැහැණුන් අනුපාතය | වැඩසටහනේ ස්වභාවය සහ දේශීය සංදර්භය අනුව මෙම දර්ශකය තවදුරටත් විධිමත් කළ යුතුය ඇතුළත් කළ යුතු මහජන රැස්වීම් වර්ග, කාලසීමාව (උදා: මාස හයක් වැනි) සහ වැඩසටහන් මට්ටම (ඍජු වැඩසටහන් ප්‍රතිලාභීන් සඳහා) එමගින් නිශ්චය කළ යුතුය. |

| මූලෝපාය | බලපෑම | ප්‍රතිඵල | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|---|
| **S**<br>**සේවා තහවුරු කර තිබේ** | කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත<br><br>නිවාසවල ප්‍රජාවේ සහ සමාජයේ වැඩිදියුණු කරන ලද සෞඛ්‍යය සහ සංවර්ධන ප්‍රතිඵල | S1. සෞඛ්‍යය, යුක්තිය, ආරක්ෂාව සහ සමාජ සේවා වෙතින් ආයතනික ප්‍රතිචාර වැඩිදියුණු කිරීම | S1.1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී බේරුණු පුද්ගලයන්ට වැඩිදියුණු කරන ලද ප්‍රතිචාර දක්වන සේවා සම්පාදකයන් සංඛ්‍යාව | මිනුම් සඳහා වන මෙම දර්ශකය සහ ප්‍රවේශය දේශීය වැඩසටහන් සංදර්භයට සහ ඉලක්ක සේවා ආයතනවලට අනුව සකස් කරගත යුතුය. වැඩිදියුණු කරන ලද ආයතනික ප්‍රතිචාර මගින් අංශ රැසක් ආවරණය කරනු ලැබේ. ඒවා නම්, ප්‍රතිපත්ති සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම, සේවා ප්‍රතිචාර සඳහා පටිපාටි සහ ප්‍රොටොකෝල, සමාජභාවී පරිවර්තන ව්‍යුහයන් හෝ විෂයමාලා සංවර්ධනය කිරීම හා ඒවා සේවා කාර්ය මණ්ඩල පුහුණුවීම්වලට ඇතුළත් කිරීම හා පුහුණු පහසුකම් සැපයීම, පරිපූර්ණ යොමුකිරීම් පද්ධතියක් සංවර්ධනය කිරීම වේ. විවිධ සේවා අංශ සම්බන්ධ වැඩිදියුණු කරන ලද ආයතනික ප්‍රතිචාර සම්බන්ධයෙන් තිබිය හැකි උප දර්ශක පිළිබඳ ඇතැම් උදාහරණ Violence Against Women and Girls: A Compendium of Monitoring and Evaluation Indicators වෙතින් ලබාගත හැකිය. |
| | | S2. සමාජභාවී සමානාත්මතාව සමාජ සම්මතයක් ලෙස පිළිගෙන ප්‍රවර්ධනය කරන සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිනොගන්නා සේවා සම්පාදකයන් සහ ආයතන | S2.1. අඩු වශයෙන් එක් වතාවක් හෝ සැමියා (පිරිමි) විසින් බිරිඳට (සහකාරියට) පහර දීම සාධාරණ යයි එකඟ වන ජන අනුපාතය ලිංගිකභාවය සහ වයස අනුව වෙන්කර | R3.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – මූලෝපායේ 'ජනයා' ලෙස හැඳින්වෙන්නේ සේවා සම්පාදකයාගේ කාර්ය මණ්ඩලයේ පුද්ගලයන් සේවාව අනුව වෙන්කර වේ. |
| | | | S2.2. සමාජභාවී සාධාරණත්වය පිළිබඳ ආකල්ප සහිත ජන අනුපාතය | R3.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – මූලෝපායේ 'ජනයා' ලෙස හැඳින්වෙන්නේ සේවා සම්පාදකයාගේ කාර්ය මණ්ඩලයේ පුද්ගලයන් සේවාව අනුව වෙන්කර වේ. |
| | | | S2.3. සමාජභාවී සමානාත්මතාව සම්බන්ධයෙන් වෙනම අභ්‍යන්තර ප්‍රතිපත්තියක් සේවා සම්පාදකයා සතුය | ආයතනයක සමාජභාවී සමානාත්මතාව කෙරෙහි කැපවීම මැනීමෙහි එක් ක්‍රමයක් වන්නේ, සමාජභාවය සම්බන්ධයෙන් එහි අභ්‍යන්තර ප්‍රතිපත්ති, පටිපාටි සහ භාවිතාවන් පරීක්ෂා කිරීමයි. මෙම දර්ශකය එක් සරල උදාහරණයකි. එහෙත්, කිසියම් ආයතනයක සමාජභාවී සමානාත්මතා ප්‍රතිපත්තියක අවම මූලිකාංග නිශ්චය කිරීම සඳහා එය වැඩිදුරටත් සංවර්ධනය කළ යුතුය. ආයතනයේ සමාජභාවී විගණනයක් හෝ ධාරිතා තක්සේරුවක් හෝ සිදුකිරීමෙන් හෝ ඇතැම් සමාජභාවී ඒකාබද්ධ කිරීම්/ මූලධාරාගත කිරීම් සම්බන්ධ පරීක්ෂා ලැයිස්තු සම්පාදනය කිරීමෙන් මෙම දර්ශකය ශක්තිමත් කළ හැකිය. උදාහරණ සඳහා එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ Gender Equality Capacity Assessment Tool ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ A Manual for Gender Audit Facilitators. |
| | | | S2.4. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වෙනම ක්‍රියාවලියක් සේවා සම්පාදකයා සතුය | සමාජභාවී වෙනස්කම් කිරීම් සම්බන්ධ අභ්‍යන්තර පැමිණිලි, ලිංගික හිංසනය සහ සමාජභාවී ප්‍රචණාඩත්වය සම්බන්ධයෙන් සංවිධානයක් කටයුතු කරන ආකාරය එම සංවිධානය කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට කැපවීම සම්බන්ධ මනා දර්ශකයකි. ආයතනයේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම හා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්තියක අවම මූලිකාංග නිශ්චිත කර දැක්වීම සඳහා මෙය හෝ මේ හා සමාන දර්ශකයක් භාවිතා කළ හැකිය. එසේම, වැඩිදුර සංවර්ධනය කරගත යුතුය. |

## අධීක්ෂණය සහ ඇගයීම

| මූලෝපාය | බලපෑම | ප්‍රතිඵල | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|---|
| | | S3. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සේවාවන්ගේ වැඩිදියුණු කරන ලද ගුණාත්මකබව සහ ආරක්ෂාව | S3.1. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සේවාවන්ගේ ගුණාත්මකබව සහ ආරක්ෂාව පිළිබඳ වැඩි තෘප්තිමත්භාවයක් වාර්තා කරන කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුහුණදී බේරුණු පුද්ගලයන් අනුපාතය | මෙම දර්ශකය දේශීය වැඩසටහන් සංදර්භයට අනුව අනුරූප කරගත යුතුය. සම්පාදනය කරනු ලබන සේවයේ ස්වභාවය සහ ඒ හා අනුගත ගුණාත්මකභාවය සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රමිති එයට ඇතුළත්ය. උදාහරණයක් ලෙස, ගුණාත්මක සේවාවල තිබිය හැකි ප්‍රමිති මගින් ප්‍රවේශය, ලබාගැනීමේ හැකියාව, ලබාගැනීමට තිබීම, කාර්ය මණ්ඩල දැනුම, බේරුණු පුද්ගලයන්ට ප්‍රතිකාර කිරීම සහ දුෂ්කර තත්වයන් හසුරුවාගැනීමේ සංවේදීභාවය ආදිය ඉලක්ක කළ හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සේවාවන්ගේ ආරක්ෂාව සම්බන්ධ ඇතිවිය හැකි ප්‍රමිතිවලට පෞද්ගලිකත්වය, විශ්වසනීයත්වය සහ වැඩිදුර ප්‍රචණ්ඩත්වයේ අවදානම අවම කිරීම ඇතුළත් විය හැකිය.<br><br>සේවා සම්බන්ධයෙන් බේරුණු පුද්ගලයන්ගේ තෘප්තිය මැනීමේ එක් ක්‍රමයක් වන්නේ, සේවාදායක තෘප්තිය හෝ පිටවීම සම්බන්ධ සමීක්ෂණයයි. එය සෞඛ්‍ය සේවා මැදිහත්වීම් සම්බන්ධයෙන් පුළුල්ව භාවිතා කරනු ලැබේ. සේවා සම්පාදනය ආශ්‍රිත විවිධ ප්‍රමිති හෝ අත්දැකීම් සඳහා වන විශේෂිත සමීක්ෂණ අංග එයට අයත් වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට අදාළ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවාලාභී පිටවීමේ සමීක්ෂණයක් සඳහා උදාහරණයක් පහත සබැඳියෙහි දැක්වේ: Improving the Health Sector response to Gender based Violence: A Resource Manual for Health Acre Professionals in Developing Countries. |
| | | S4. බේරුණු පුද්ගලයන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සේවා ලබාගැනීම වර්ධනය වීම | S4.1. කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සේවා භාවිතා කරන බේරුණු පුද්ගලයන්ගේ අනුපාතය | මෙම දර්ශකය මගින් ප්‍රචණ්ඩත්වය අත්දැක තිබෙන කාන්තාවන් විසින් නිල වශයෙන් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සේවා භාවිතා කිරීම මනිනු ලැබේ. බේරුණු පුද්ගලයන්ගේ උපකාර සෙවීමේ චර්යාවන්ට අදාළ ප්‍රශ්න WHO MCS හි අඩංගු වේ. නොනිල ක්‍රියාකරුවන් සහ ජාලයන් හමුවේ පළකරනු ලබන චර්යාවන් ද එයට අයත් වේ (උදා: මිතුරන්, පවුල, අසල්වැසියන්, ප්‍රජාව හෝ ආගමික නායකයන්). පසුගිය මාස 12 තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අත්දැකීම් ලැබූ බව වාර්තා කරන කාන්තාවන්ගෙන් මෙම ප්‍රශ්න අසනු ලැබේ. |
| **P**<br>**දිළිඳුකම අවම කර ඇත** | කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත | P1. පවුල් දරිද්‍රතාව සහ ආර්ථික පීඩනය අවම කර තිබේ. | P1.1. ආහාර අනාරක්ෂිතභාවය වාර්තා කරන ගැහැණුන් හා පිරිමින් අනුපාතය ලිංගිකත්වය අනුව වෙන්කර | පවුලේ ආහාර අනාරක්ෂිතභාවය පවුල් දරිද්‍රතාව මැනීම සඳහා සුලබව භාවිතා කරනු ලැබේ. එය අධ්‍යයන ගණනාවකම හමුවී තිබේ. එය කාන්තාවන්ගේ සමීප සහකරු ප්‍රචණ්ඩත්ව අත්දැකීම සහ පිරිමින්ගේ සමීප සහකරු ප්‍රචණ්ඩත්ව අත්දැකීම සමග ශක්තිමත් ලෙස සම්බන්ධ වේ. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී) නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). ආහාර අනාරක්ෂිතභාවය මනිනු ලබන මෙවලම් අතරට පහත දැක්වෙන අංග ඇතුළත් වේ: ආහාර අනාරක්ෂිතභාවයේ පරිමාණය සහ පවුලේ ආහාර අනාරක්ෂිතභාවය සම්බන්ධ ප්‍රවේශයේ පරිමාණය. |
| | නිවාසවල ප්‍රජාවේ සහ සමාජයේ වැඩිදියුණු කරන ලද සෞඛ්‍යය සහ සංවර්ධන ප්‍රතිඵල | | P1.2. සමස්ත ගෘහස්ථ පරිභෝජනය | පාරිභෝජනය පවුල් දරිද්‍රතාවේ වැදගත් මිනුමකි. ආහාර, නිවාස, බලශක්ති/ ඉන්ධන, ගෘහ උපකරණ, ප්‍රවාහනය, අධ්‍යාපනය සහ වෙනත් භාණ්ඩ හා සේවා එයට අයත් වේ. දත්ත මූලාශ්‍ර සහ ඒ හා සම්බන්ධ මෙවලම් ද ජාතික ආදායම් වියදම් සමීක්ෂණයෙන් ලබාගත හැකිය. වැඩිදුර මාර්ගෝපදේශ Evidence Consortium on Women's Groups (ECWG) Guide for Measuring Women's Empowerment and Economic  Outcomes in Impact Evaluations of Women's Groups වෙතින් ලබාගත හැකිය. |
| | | | P1.3. ආතතිය අත්දැක තිබෙන බව වාර්තා කරන ගැහැණුන් හා පිරිමින් අනුපාතය | ආතතිය දුර්වල මානසික සෞඛ්‍යයේ හා චිත්තවේගී යහපැවැත්වේ නිර්ණායකයකි. දිළිඳුකම සහ ආතතිය අතර සම්බන්ධය සහ ආතතිය සහ ප්‍රචණ්ඩත්වයේ වැරදිකාරීත්වය අතර සම්බන්ධය ලේඛනගත වී තිබේ. මෙම දර්ශකය මගින් කාන්තාවන්ගේ සහ පිරිමින්ගේ පොදු ආතතිය සම්බන්ධයෙන් ස්වයංව වාර්තා කරන ලද අත්දැකීම් මනිනු ලැබේ. ආතතිය මැනීම සඳහා පුළුල්ව භාවිතා කරන මෙවලමක් වන්නේ Perceived Stress Scale (PSS - අනුමාන ආතති පරිමාණය) වේ. එය බහුවිධ රාජ්‍ය සංදර්භයන්හිදී භාවිතා කර තිබේ. එය පුද්ගලයන් තම ජීවිතයේ වත්මන් තත්වය කෙතරම් ආතතික ලෙස සලකන්නේද යන්න ගැන මිනුමකි. |

## අධීක්ෂණය සහ ඇගයීම

| මූලෝපාය | බලපෑම | ප්‍රතිඵල | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|---|
| | | P2. කාන්තාවන් ආර්ථික සුරක්ෂිතබව වර්ධනය කරගෙන ඇත | P2.1. ආර්ථික සුරක්ෂිතභාවය වාර්තා කරන ගැහැණුන් අනුපාතය | ආර්ථික ආරක්ෂාව මූලික අවශ්‍යතා සහ ස්ථාවර ආදායම් හෝ වියදම් සඳහා ප්‍රවේශය ලෙස අර්ථ නිරූපණය කළ හැකිය. මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය උදා: භූගෝලීය ප්‍රදේශයකදී) නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). ආර්ථික ආරක්ෂාව සහ සවිබලගැන්වීම මනින මෙවලම් එකතුවක් අබ්දුල් ලතීෆ් ජමීල් විසින් සම්පාදනය කරන ලද Poverty Action Lab (J-PAL) ලේඛනයෙහි, A Practical Guide to Measuring Women's and Girls' Empowerment in Impact Evaluations හි අඩංගු වේ. කාන්තාවන්ගේ ආර්ථික සවිබලගැන්වීම මැනීමේ වැඩිදුර මාර්ගෝපදේශ Women's Economic Empowerment: A Roadmap වෙබ්අඩවියෙහි තිබේ. |
| | | P3. කාන්තාවන් මූල්‍ය සුරක්ෂිතබව වර්ධනය කරගෙන ඇත | P3.1. වැඩිවූ මූල්‍ය ස්වාධීනත්වය වාර්තා කරන ගැහැණුන් අනුපාතය | බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ E3.1 බලන්න |
| **E**<br>**පරිසරය සුරක්ෂිත කරනු ලැබේ.** | කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත<br><br>ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරලා තිබේ | EN1. පාසල්, සේවා ස්ථාන, වෙනත් ආයතන සහ පොදු අවකාශ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට සුරක්ෂිත වේ. | EN1.1. පාසලේදී, සේවා ස්ථානයේදී සහ පොදු ස්ථානවලදී ආරක්ෂිත බව වාර්තා කරන ගැහැණුන් සහ ගැහැණු ළමයින් අනුපාතය ලිංගිකභාවයසහ වයස අනුව වෙන්කර | බහුවිධ සංදර්භයන්හිදී කාන්තාවන් සහ ගැහැණු ළමයින්ට ආරක්ෂාව දැනීම මෙම දර්ශකය විසින් මනිනු ලැබේ. එයට පාසල් සහ වෙනත් අධ්‍යාපන පරිශ්‍රයන් ද, සේවා ස්ථාන සහ පොදු අවකාශයන් ද අයත් වේ. ආරක්ෂා වීම යන්නෙන් අදහස් කරනු ලබන්නේ ප්‍රචණ්ඩත්වය, හිංසනය හෝ සූරාකෑම සම්බන්ධ අවදානමක් අත්දැකීමට නොලැබීමයි. මෙම දර්ශකය සඳහා මිනුම් පසුබිම අනුව වෙනස් වේ.<br><br>Global school-based student health survey (GSHS - ගෝලීය පාසල් පාදක සෞඛ්‍ය සමීක්ෂණය) තුළ පාසල් යන අතරමගදී ආරක්ෂාව පිළිබඳ සිසුන්ගේ අවබෝධය මනින අංග අඩංගු වේ. ගෙදරදී, ප්‍රජාවේදී සහ පාසලේදී ඇතුළු විවිධ පරිසරයන්හිදී ආරක්ෂාව සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ළමයින්ගේ හා තරුණ පුද්ගලයන්ගේ දැක්ම හා අත්දැකීම් මනින පරිපූර්ණ අංග කට්ටලයක් VACS හි අඩංගු වේ. |
| | | EN2. ප්‍රජාවන් සහ ආයතන සමාජභාවී සමානාත්මතාව සමාජ සම්මතයක් ලෙස පිළිගනියි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තවදුරටත් පිළිග න්නේ නැත. | EN2.1. ස්වාමියකු (පුරුෂයකු) තම බිරිඳට (සහකාරියට) එක් අවස්ථාවකදී හෝ පහරදීම සාධාරණීකරනය කරන ජනයාගේ අනුපාතය ලිංගිකභාවය හා වයස අනුව වෙන් වෙන්ව | R3.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – EN මූලෝපායෙහි 'ජනයා' යනුවෙන් හැඳින්වෙන්නේ ප්‍රජා සාමාජිකයන්, ගුරුවරුන්, සේවාස්ථානයේ සමානයන් කළමනාකරුවන් සහ රාජකාරි වගකීම් දරන්නන් |
| | | | EN2.2. සමාජභාවී සාධාරණත්වය පිළිබඳ ආකල්ප සහිත ජන අනුපාතය | R3.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – EN මූලෝපායෙහි 'ජනයා' යනුවෙන් හැඳින්වෙන්නේ ප්‍රජා සාමාජිකයන්, ගුරුවරුන්, සේවාස්ථානයේ සමානයන් කළමනාකරුවන් සහ රාජකාරි වගකීම් දරන්නන් |
| | | | EN2.3. ආයතනය තම ප්‍රතිපත්ති සමාජභාවී සමානාත්මතාව වෙනුවෙන් කැපකර තිබේ. | S2.3 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |

| මූලෝපාය | බලපෑම | ප්‍රතිඵල | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|---|
| | | | EN2.4. අභ්‍යන්තර කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැමිණිලි පාලනය සඳහා කැපවුණ ප්‍රතිපත්තියක් ආයතනයෙහි තිබේ. | S2.4 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | EN3. ප්‍රජාවන් තුළ සහ ඉන් ඔබ්බෙහි කාන්තාවන්ගේ වැඩිවුණු නිදහස් සංචලනය | EN3.1. පසුගිය මාසය තුළදී a) තම ප්‍රජාව තුළ කොහේ හෝ යාමට b) තම ප්‍රජාවෙන් පිටත කොහේ හෝ යාමට කාන්තාවන් තම නිවෙස්වලින් පිටත ගිය සාමාන්‍ය වාර ගණන. | කාන්තාවන්ගේ වර්ධනය වූ සංචලනය මගින් සවිබලගැන්වීම නිරූපණය කර සවිබලගැන්වීම වර්ධනය කළ හැකිය. එහෙත්, කාන්තාවන් හට තම පරිසරයට පිවිසීම සඳහා විශ්වාසය හා සුරක්ෂිතබව හැඟෙන බව ද නිරූපණය කළ හැකිය. මෙම දර්ශකය පසුගිය මාසය තුළ තම ප්‍රජාව තුළ සහ ඉන් පිටත කාන්තාවන්ගේ සංචලනය මනියි. එය ඔවුන් පරිසරය භාවිතා කිරීම සම්බන්ධයෙන් වැදගත් මිනුමකි. එය<br><br>පොදු අවකාශය තුළ චලනය වීමේදී කාන්තාවන්ට සුරක්ෂිතබව හැඟෙන බව තහවුරු කිරීම සඳහා EN1.1 දර්ශකය සමග විශ්ලේෂණය කළ යුතුය. පසුගිය මාසය තුළ කාන්තාවන් කීවරක් තම ප්‍රජාවෙන් පිටත ගියාද, එසේ ගියේ තනිවද වෙනත් අයෙකු සමගද යන්න ඇතුළු අතිරේක ප්‍රශ්න ඇසිය හැකිය. |
| **C**<br>**ළමා සහ නව යොවුන් අපයෝජන වළක්වාඇත** | කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත<br><br>ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරලා තිබේ | C1. මව්පියන් සහ භාරකරුවන් ධනාත්මක මාපිය භාවිතාවන් ශක්තිමත් කරයි. වඩා ආදරණීය සහ උපකාරශීලී ලෙස මව්පියන් හා දරුවන් අතර සම්බන්ධතා පවත්වයි. | C1.1. පසුගිය මාසය තුළදී කිසියම් ප්‍රචණ්ඩ නොවන ක්‍රමයක් මගින් භාරකරුවකු විසින් විනයගත කරනු ලැබීමේ අත්දැකීම ලද වයස අවුරුදු 1 - 17 අතර ගැහැණු හා පිරිමි ළමයින් අනුපාතය ලිංගිකභාවයසහ වයස අනුව වෙන්කර | මෙම ප්‍රතිඵල ප්‍රකාශය තිරසර සංවර්ධන අරමුණු දර්ශක 16.2.1 සමග සහ INSPIREහි 6 ප්‍රතිඵලය සම්බන්ධ වේ. එහි අංශ තුනක් තිබේ: එනම්, භාරකරුවන් විසින් ධනාත්මක ලෙස විනයගත කිරීම, ළමයින් හා මව්පියන් අතර ධනාත්මක සම්බන්ධතා සහ මව්පිය/භාරකාර අධීක්ෂණය.<br><br>මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී) නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්).<br><br>මෙම දර්ශකය සඳහා භාවිතා කළ හැකි වැඩිදුර මෙවලම් INSPIRE Indicator Guidance and Results Framework වෙතින් ලබාගත හැකිය. MICS වෙතින් ලබාගත් ඒවා ඇතුළු ආදර්ශ ප්‍රශ්න එහි තිබේ. |
| | | C2. සමාජභාවී සමානාත්මතාව සමාජ සම්මතයක් ලෙස ප්‍රවර්ධනය කරන සහ කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තවදුරටත් විශ්වාස නොකරන පවුල්, ප්‍රජාවන් සහ ආයතන | C2.1. අඩු වශයෙන් එක් වතාවක් හෝ සැමියා (පිරිමි) විසින් බිරිඳට (සහකාරියට) පහර දීම සාධාරණ යයි එකඟ වන ජන අනුපාතය ලිංගිකභාවය සහ වයස අනුව වෙන්කර | R3.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – C මූලෝපායෙහි ‘ජනයා’ යන්නෙන් අදහස් කරනු ලබන්නේ පවුල් සාමාජිකයන්, ප්‍රජාවේ සාමාජිකයන්, ගුරුවරුන් සහ වගකීම් දරන්නන්ය. |

## අධීක්ෂණය සහ ඇගයීම

| මූලෝපාය | බලපෑම | ප්‍රතිඵල | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|---|
| | | | C2.2. සමාජභාවී සාධාරණත්වය පිළිබඳ ආකල්ප දරණ ජන අනුපාතය | R3.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – C මූලෝපායෙහි 'ජනයා' යන්නෙන් අදහස් කරනු ලබන්නේ පවුල් සාමාජිකයන්, ප්‍රජාවේ සාමාජිකයන්, ගුරුවරුන් සහ වගකීම් දරන්නන්ය. |
| | | | C2.3. සමාජභාවී සමානාත්මතාව සම්බන්ධයෙන් ඇපකැප වූ අභ්‍යන්තර ප්‍රතිපත්තියක් පාසල්වල තිබේ. | S2.3 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | | C2.4. අභ්‍යන්තරිකව කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කැපවූ ක්‍රියාවලියක් පාසලේ තිබේ. | S2.4 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | C3. ගැහැණු හා පිරිමි ළමයින්ට සමාන අවස්ථා ලබාදී තිබේ. | C3.1. පිරිමි සහ ගැහැණු ළමයින්ට සමාන අවස්ථා ලබාදුන් බව වාර්තා කරන මව්පියන් අනුපාතය ලිංගිකත්වය අනුව වෙන්කර | මව්පියන් විසින් කාන්තාවන් සහ පිරිමි ළමයින් හට සමාන අවස්ථා සැපයීම තුළ අධ්‍යාපනයේ හෝ ආරක්ෂිත, සාධාරණ ලෙස වැටුප් ගෙවන රැකියා, වැඩිහිටියකු ලෙස විවාහට තෝරාගැනීමේ අයිතිය, ගෘහස්ථ වගකීම් බෙදාගැනීමේදී සහ නිදහස් සංචලනයේදී සමාජභාවී සමානාත්මතාව අයත් විය හැකිය. නිර්ණායකය මැනීම දේශීය වැඩසටහන් සංදර්භයට අනුකූල කරගත යුතුය. මැදිහත්වීම මගින් ආමන්ත්‍රණය කිරීමට බලාපොරොත්තු වන අවස්ථා වර්ග එයට ඇතුළත්ය. |
| | | C4. සමාජභාවී සමානාත්මතාව සහ ගරුත්වය පාසල්වල, ඉගෙනුම් හා සම වයස් පරිසරවල භාවිතා කර තිබේ. | C4.1. සමාජභාවී සමානාත්මතාව සහ ගෞරවනීය සම්බන්ධතා නිරූපණය කරන පාසල්, ඉගෙනුම් හා සම වයස් පරිසරයන් සංඛ්‍යාව | වැඩසටහන් සංදර්භය සහ ඉලක්ක කණ්ඩායම් අනුව මෙම ප්‍රතිඵලය සඳහා වන දර්ශකය වඩා නිශ්චිත කළ යුතුය. උදාහරණයක් ලෙස, පාසල් සහ ඉගෙනුම් පරිසරයන් විසින් සමාජභාවී සමානාත්මතාව ප්‍රදර්ශනය කිරීම තුළට ගුරුවරුන් ගැහැණු හා පිරිමි ළමයින්ට පන්ති කාමරය තුළදී සමාන අන්දමින් සැලකීම අයත් වේ. වටිනාකම්, සම්මානනය සම්බන්ධ ආදර්ශ නිර්මාණය කිරීම සහ අනෙක් අයගේ හිමිකම් සැලකිල්ලට ගැනීම ගෞරවනීය සම්බන්ධකම්වලට අයත් වේ. |
| | | C5. පාසල් හා පොදු ස්ථාන ගැහැණු හා පිරිමි ළමයින්ට ආරක්ෂිත වේ. | C5.1. ආරක්ෂිත බව වාර්තා කරන ගැහැණු සහ පිරිමි ළමයින් අනුපාතය | මෙම දර්ශක INSPIRE outcome indicator 9.2 සමග සම්බන්ධ වේ. පාසලේදී හෝ පාසලට යද්දී සහ එද්දී ළමයින්ගේ ආරක්ෂාව කෙරෙහි අවධානය යොමුකරන මෙම දර්ශකය ජනගහන මට්ටමේදී මැනිය හැකිය (උදා: භූගෝලීය ප්‍රදේශයකදී) නැතිනම් වැඩසටහන් මට්ටමේදී මැනිය හැකිය (උදා: සෘජු වැඩසටහන් ප්‍රතිලාභීන් වෙතින්). |
| | | | ලිංගිකභාවය සහ වයස අනුව වෙන්කර | ගෝලීය පාසල් පාදක ශිෂ්‍ය සෞඛ්‍ය සමීක්ෂණයෙහි (GSHS) පාසලේදී හා පාසල් යන එන මගදී ආරක්ෂාව පිළිබඳ සිසුන්ගේ දැක්ම අඩංගු වේ. නිවස, ප්‍රජාව සහ පාසල ඇතුළු විවිධ පසුබිම්වලදී ආරක්ෂාව පිළිබඳ සිසුන්ගේ දැක්ම මනින පරිපූර්ණ ප්‍රශ්න කට්ටලයක් VACS හි ද අඩංගු වේ. |

## අධීක්ෂණය සහ ඇගයීම

| මූලෝපාය | බලපෑම | ප්‍රතිඵල | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|---|
| | | C6. අධ්‍යාපනඥයෝ විනය ඇතිකිරීම සඳහා ධනාත්මක, අහිංසාවාදී ස්වරූප අනුගමනය කරති. | C6.1. අවසාන අවස්ථා තුනෙහිදී විනය ඇතිකිරීම සඳහා විකල්ප, අහිංසාවාදී ස්වරූප අනුගමනය කරන අධ්‍යාපනඥයන් අනුපාතය | පාසල් තුළ හෝ වෙනත් ඉගෙනුම් පරිසරයන් තුළ සිටින ගුරුවරුන් සහ වෙනත් අධ්‍යාපනික කාර්යමණ්ඩල අධ්‍යාපනඥයන් අතරට අයත් වේ. තරුණ සමාජ, ප්‍රජා මධ්‍යස්ථාන හෝ ළමයින් සහ තරුණ පුද්ගලයන් ඉගෙනුමට සහභාගී වන වෙනත් අවකාශයන් (ඔවුන් පාසලට බැඳී හෝ පාසලෙන් පිටත) ද මෙයට අයත් වේ. අහිංසාවාදී විනයගත කිරීමේ ස්වරූපවලට ශාරීරික සහ මානසික දඬුවම්වලට විරුද්ධ වීම සහ විකල්ප විනයගත කිරීමේ ක්‍රම භාවිතා කිරීම අයත් වේ. වැඩිපුර ගෙදර වැඩ සහ අධ්‍යාපනික වැඩ පැවරීම, පන්තියෙන්/ කණ්ඩායමෙන් සමාවගන්නැයි ළමයාට කීම, ළමයාගේ දුර්වල චර්යාව ගැන සාකච්ඡා කිරීමට මව්පියන්ට පාසලට එන්නැයි කීම ආදිය එවැනි විකල්ප ක්‍රම වේ. ළමයකු විනයගත කළ අවසන් අවස්ථා තුනෙහිදී අනුගමනය කළේ කුමන ක්‍රමයදැයි අධ්‍යාපනඥයන්ගෙන් ඇසීමෙන් මෙම දර්ශකය මැනිය හැකිය. එහිදී ප්‍රචණ්ඩ සහ ප්‍රචණ්ඩ නොවන ක්‍රමවල බහුවිධ තෝරාගැනීම් සිදුකළ හැකිය. |
| **T**<br>**ආකල්ප, විශ්වාසයන් සහ සමාජ සම්මතයන් පරිවර්තනය කිරීම** | කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කර හෝ දුරු කර ඇත | T1. පවුල්, ප්‍රජාවන් සහ ආයතන සමාජභාවී සමානාත්මතාව සමාජ සම්මතයක් ලෙස ප්‍රවර්ධනය කිරීම විශ්වාස කරති. තවදුරටත් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිනොගනිති. | T1.1. අඩු වශයෙන් එක් වතාවක් හෝ සැමියා (පිරිමි) විසින් බිරිඳට (සහකාරියට) පහර දීම සාධාරණ යයි එකඟ වන ජන අනුපාතය ලිංගිකභාවයසහ වයස අනුව වෙන්කර | R3.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – T මූලෝපායෙහි 'ජනයා' යනුවෙන් හැඳින්වෙන්නේ පවුලේ, ප්‍රජාවේ සාමාජිකයන් සහ රාජකාරි වගකීම් දරන්නන්ය. |
| | | | T1.2. සමාජභාවී සාධාරණත්වය පිළිබඳ ආකල්ප සහිත ජන අනුපාතය | R3.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න – T මූලෝපායෙහි 'ජනයා' යනුවෙන් හැඳින්වෙන්නේ පවුලේ, ප්‍රජාවේ සාමාජිකයන් සහ රාජකාරි වගකීම් දරන්නන්ය. |
| | | | T1.3. කාන්තාවක හෝ පිරිමියකු X ආකාරයෙන් කටයුතු කළහොත් ප්‍රජාවේ අනෙක් අය X ආකාරයෙන් ප්‍රතිචාර දක්වනු ඇතැයි විශ්වාස කරන අනුපාතය | සමාජ සම්මතයන් යනු ජනගහනය විසින් හෝ කණ්ඩායම් විසින් බෙදාහදාගනු ලබන චර්යා නීති වේ. වෙනත් අය කරන්නේ කුමක්ද යන්න සහ යමෙකු අපේක්ෂා කරන්නේ කුමක්ද යන්න පිළිබඳ විශ්වාසයන් එයට අයත් වේ. සමාජ සම්මතයන් තේරුම්ගැනීම සඳහා නිශ්චිත සමාජ සම්මතයන් යනු මොනවාද, එම සම්මතයන් වෙනුවෙන් අදාළ වන කණ්ඩායම් මොනවාද, පුද්ගලයන්ගේ චර්යාවන් වෙනස්කිරීම වළක්වන ධනාත්මක හා ඍණාත්මක සමාජ සම්බාධක යනු මොනවාද, චර්යාත්මක වෙනස්කම්වලට ව්‍යතිරේඛ තිබේද (උදා: සමාජ සම්මතයක් බිඳීම පිළිගත හැකි අවස්ථාවක්) යනාදිය පිළිබඳ විශ්ලේෂණාත්මක ප්‍රවේශයක් විය යුතුය. එවැනි විශ්ලේෂණයක් මෙහෙයවීම සඳහා සමාජ සම්මතයක මෙවැනි එකිනෙකට වෙනස් අංග (එනම්, යොමුකිරීම් කණ්ඩායම්, සම්බාධක, ව්‍යතිරේඛ) මැනීම අවශ්‍යය. ඒ සඳහා බහුවිධ දර්ශක අවශ්‍යය.<br><br>මෙම දර්ශකය යනු සමාජ සම්බාධක සහ ප්‍රජාවක වෙනත් අය නිශ්චිත චර්යාවකට ප්‍රතිචාර දක්වන්නේ කෙසේදැයි මැනීම සඳහා භාවිතා කරනු ලබන උදාහරණයකි. චර්යාවන් සහ ප්‍රතිචාර වැඩසටහන් සංදර්භය සහ අපේක්ෂිත වෙනස අනුව හැඩගස්වාගත යුතුය. උදාහරණයක් ලෙස, වැඩසටහන් අරමුණක් වන්නේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සෙසු අය අත නොපෙවිය යුතු පවුලේ කාරණයක් වීම ආශ්‍රිත සමාජ සම්මතයන් වෙනස් කිරීම නම්, යෝග්‍ය දර්ශකයක් වන්නේ, පිරිමියකු සමීප සහකරු ප්‍රචණ්ඩත්වයේ යෙදෙන අවස්ථාවකදී ප්‍රජාවේ සෙසු අය මැදිහත්විය යුතුය යයි සිතනජන අනුපාතයයි.<br><br>සමාජ සම්මතයන් විශ්ලේෂණය කිරීම සඳහා භාවිතා කළ හැකි මෙවලම් රැසක් තිබේ. CAREහි සමාජ සම්මත විශ්ලේෂණ මූලෝපාය එවැනි ඒවා වේ. මේවා සහ සමාජ සම්මතයන් මැනීමේ වෙනත් මූලාශ්‍ර පහත දැක්වෙන වෙබ් අඩවියෙන් ලබාගත හැකිය: Advancing Learning and Innovation on Gender Norms (ALIGN) |

| මූලෝපාය | බලපෑම | ප්‍රතිඵල | දර්ශක | මාර්ගෝපදේශ |
|---|---|---|---|---|
| | | T2. සමාජභාවී සමානාත්මතාව සහ ගරුත්වය සමීප පවුල් සහ ප්‍රජා සම්බන්ධතා තුළ භාවිතා කරනු ලැබේ. | T2.1. පවුලේ තීරණගැනීමට සහභාගී වන (තනිව හෝ ඒකාබද්ධව) වයස අවුරුදු 15 - 49 අතර වර්තමානයේදී සහකාරියන් වී සිටින කාන්තාවන්ගේ අනුපාතය | R1.1 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | | T2.2. සමාජභාවී වශයෙන් සාධාරණ අන්දමින් ගෘහ කටයුතු බෙදාගන්නා බව වාර්තා කරනගැහැණුන් සහ පිරිමින් අනුපාතය | R1.2 බලපෑම් දර්ශකය සඳහා මාර්ගෝපදේශ බලන්න |
| | | | T2.3. වෙනත් ප්‍රජාවන්ගේ සාමාජිකයන් වැදගත් කරුණු සම්බන්ධයෙන් තම අදහස් විමසා ඇති බව පවසන ගැහැණුන් අනුපාතය | මෙම දර්ශකය විසින් ප්‍රජා තීරණවලදී කාන්තා සහභාගීත්වය මනිනු ලැබේ. එමගින් කාන්තාවන්ගේ වටිනාකම, ඔවුන්ගේ මතයන් සහ ප්‍රජා කාරණාවලදී ඔවුන්ගේ සහභාගීත්වය සම්බන්ධ සමාජ සම්මතයන්ගේ වෙනස්කම් නිරූපණය කළ හැකිය. ප්‍රජාවේ සාමාජිකයන් ඔවුන්ගේ අදහස් විමසා තිබේදැයි සමීක්ෂණ ප්‍රශ්නයක් ඇසිය හැකිය. එසේ විමසනු ලැබුවේ කුමන කාරණා සම්බන්ධයෙන් කුමන අදහස්ද යන්න පිළිබඳ ඉන් පසු ප්‍රශ්න ඇසිය හැකිය. |

# පසු සටහන

[1] මූලාශ්‍රවලට පහත දැක්වෙන ඒවා අයත් වේ: Programming Essentials, Monitoring & Evaluation. UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls; DFID (2012) How to Note: Guidance on Monitoring and Evaluation for Programming on Violence against Women and Girls. CHASE Guidance Note Series; Programming Essentials, Monitoring & Evaluation; USAID (2014) Toolkit for Monitoring and Evaluating Gender-Based Violence Interventions Along the Relief to Development Continuum. United States Agency for International Development.

[2] Programming Essentials, Monitoring & Evaluation. UNWOMEN Virtual Knowledge Centre to End Violence against Women and Girls; Ellsberg, M. & Heise, L. (2005) Researching Violence Against Women: A Practical Guide for Researchers and Activists. World Health Organization, PATH; Global Women's Institute (2019) Participatory Monitoring and Evaluation (M&E) of Gender Based Violence Programs. SVRI Pre-Conference Workshop October 2019, The Global Women's Institute, The George Washington University; DFID (2012) How to Note: Guidance on Monitoring and Evaluation for Programming on Violence against Women and Girls. CHASE Guidance Note Series.

[3] අමතර මාර්ගෝපදේශනය සඳහා බලන්න: Global Women's Institute (2019) Participatory Monitoring and Evaluation (M&E) of Gender Based Violence Programs. SVRI Pre-Conference Workshop October 2019, The Global Women's Institute, George Washington University.

[4] García-Moreno, C., Jansen, HAFM., Ellsberg, M., Heise, L. & Watts, C. (2005) WHO multi-country study on women's health and domestic violence against women: initial results on prevalence, health outcomes and women's responses. Geneva: World Health Organization.

[5] https://dhsprogram.com/pubs/pdf/DHSQMP/DHS6_Module_Domestic_Violence_6Aug2014_DHSQMP.pdf

[6] https://mics.unicef.org/

[7] https://promundoglobal.org/programs/international-men-and-gender-equality-survey-images/

[8] Fulu, E., Jewkes, R., Roselli, T., García-Moreno, C. (2013) Prevalence of and factors associated with male perpetration of intimate partner violence: findings from the UN Multi-country Cross-sectional Study on Men and Violence in Asia and the Pacific. Lancet Global Health, 1(4): e208-e218.

[9] https://www.cdc.gov/violenceprevention/childabuseandneglect/vacs/index.html

[10] ආබාධිතභාවය මැනීම සඳහා බොහෝවිට Washington Group Short Set of Disability ප්‍රශ්න භාවිතා කරනු ලැබේ. එය ජනගහන සමීක්ෂණයන්හිදී භාවිතා කළ හැකි ප්‍රායෝගික ප්‍රශ්න හයක කට්ටලයකි. මෙම කෙටි ප්‍රශ්න කට්ටලය භාවිතා කිරීමේ යම් සීමා තිබිය හැකිය. එමගින් සියලු ප්‍රායෝගික දුෂ්කරතා මැනිය නොහැකි වනු ඇත. ආබාධිතභාවය සම්බන්ධ වඩා පරිපූර්ණ දත්ත අවශ්‍ය නම්, Washington Group Extended Set on Functioning (WG ES-F) භාවිතා කළ හැකිය. UNICEF සමග එක්ව Washington Group විසින් Child Functioning Question Set නිර්මාණය කර තිබේ. එය වයස අවුරුදු 2-17 ළමයින් සඳහා භාවිතා කළ හැකිය.

[11] සමාජභාවී ආකල්ප මැනීම සඳහා භාවිතා කළ හැකි මෙවලම් පරාසයක්ම තිබේ. IMAGES ඇතුළු සමීක්ෂණ කීපයක් සකස් කරගෙන තිබෙන්නේ Gender Equitable Mens (GEM) Scale ඇසුරෙනි. Gender Equity Scale ද විවිධ පසුබිම්වලදී භාවිතා කරනු ලැබේ. විවිධ තත්වයන් පහකදී බිරිඳට පහරදීම නිවැරදි යයි සැලකීම DHS මිනුම් මගින් මනිනු ලැබේ. එයට බිරිඳ ආහාර පිළිස්සීම, සැමියා සමග වාද කිරීම, සැමියාට නොකියා පිටත යාම, ළමයින් නොතකාහැරීම සහ සැමියා සමග ලිංගික සංසර්ගයට අකැමැති වීම ඇතුළත් වේ. මෙම DHS මෙවලම විවිධ අධ්‍යයනයන්හිදී අමතර අවස්ථා මැනීම සඳහා සකස් කරගෙන තිබේ. උදාහරණයක් ලෙස, බිරිඳක සැමියාට හිතවත් නොවේ නම්, එය මෙමගින් මැනිය හැකිය.

[12] උදාහරණයක් ලෙස, DHS Domestic Violence Module හි බේරුණු, උපකාර පතන පුද්ගලයන්ගේ උපකාර අපේක්ෂා කරන චර්යාවන් අධ්‍යයනය කරයි. ප්‍රචණ්ඩත්වයට මුහුණදුන් පසු ඔවුන් උපකාර පතන්නේ කාගෙන්ද යන කරුණ ද එහි ඇතුළත් වේ. මෙම ප්‍රශ්න සංස්කෘතික පසුබිම අනුව සකස් කරගත හැකිය.

[13] මත්පැන් භාවිතය, අපයෝජනය සහ යැපුම් ස්වභාවය මැනීම සඳහා භාවිතා කරනු ලබන මෙවලමක් පහත දැක්වේ: Alcohol Use Disorders Identification Test (AUDIT) - පහළ සහ මැද මට්ටමේ ආදායම් සහිත රටවල කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අධ්‍යයන ද එයට ඇතුළත් වේ.

[14] විෂාධයෙහි සහ කාංසාව සහ පශ්චාත් ක්ලමථ ආතති ආබාධය (PTSD) ඇතුළු වෙනත් මානසික රෝගයන්ගේ රෝග ලක්ෂණ මැනීම සඳහා විවිධ මෙවලම් රැසක් තිබේ. වැඩිහිටියන් අතර විෂාධය මැනීමේ පොදු මිනුමක් වන්නේ සංශෝධිත Center for Epidemiologic Studies Depression Scale (CESD- R) ය. එය පරිසරයන් ගණනාවක් සම්බන්ධයෙන් භාවිතා කර ප්‍රමිතිගත කර තිබේ. ළමයින් සඳහා පොදුවේ භාවිතා කරනු ලබන විෂාධ රෝග ලක්ෂණ මැනීමේ ක්‍රම අතරට Center for Epidemiologic Studies Depression Scale for Children (CES-DC) අයත් වේ. එය නව යොවුන් පුද්ගලයන් සම්බන්ධයෙන් විශ්වසනීය බව සොයාගෙන තිබේ. එහෙත්, තරුණ ළමයින් සඳහා යෝග්‍ය නැත. Children's Depression Inventory (CDI-2) එවැනි තවත් එකකි.

[15] ප්‍රචණ්ඩත්වයේ සුදානම මැනීම සඳහා මෙවලම් පරාසයක් තිබේ. ප්‍රචණ්ඩත්වයේ අත්දැකීම මැනීම සඳහා භාවිතා කිරීම සඳහා සාමාන්‍ය වශයෙන් සකස් කරගෙන තිබෙන මේවා ප්‍රාණවත් වචනවලින් ලේඛනගත කර තිබේ. උදාහරණයක් ලෙස UN MCS විසින් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය (IPV) සහ සහකරු නොවන අයගේ ලිංගික ප්‍රචණ්ඩත්වය (NPSV) සම්බන්ධ වැරදි මැනීම සඳහා WHO MCS ප්‍රශ්න කට්ටලය සකස් කරගෙන තිබේ. What Works to Prevent Violence Against Women and Girls Global Programme ඇතුළු වෙනත් අධ්‍යයනවලදී ඉන්පසු මෙම සකස් කරගන්නා ලද ප්‍රශ්න කට්ටලය භාවිතා කර තිබේ.

[16] MICS Child Discipline Module සකස් කරගෙන තිබෙන්නේ Parent-Child Conflict Tactics Scale ඇසුරෙනි. ළමයින් විනයගත කිරීම ආශ්‍රිතව මව්පියන් සහ භාරකරුවන්ගෙන් අසනු ලබන ප්‍රශ්න කට්ටලයක් එහි අඩංගු වේ. VACS හි ද අඩංගු වන්නේ ළමයින් හා නව යොවුන් පුද්ගලයන් අත්දකින ශාරීරික දඬුවම් සම්බන්ධ ප්‍රශ්න කට්ටලයකි. එය සත්කාර සපයන්නන්ගෙන් අසනවාට වඩා විශ්වසනීය මිනුමක් විය හැකිය.

[17] කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු පුද්ගලයන් සම්බන්ධයෙන් ආකල්ප මැනීම මගින් ආකල්ප පරාසයක්ම මැනිය හැකිය. දූෂණ පිළිබඳ මිථ්‍යාවන් සහ කාන්තාවන් සමීප සහකරු ප්‍රචණ්ඩත්වය ඉවසීමේ අපේක්ෂා එයට අයත් වේ. උදාහරණයක් ලෙස, Illinois Rape Myth Acceptance Scale හි කෙටි ස්වරූපයක් විවිධ සංස්කෘතික පසුබිම්වලදී ප්‍රතිචාර දක්වන්නන් අපයෝජන මිථ්‍යාවන් සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන්නන්ගේ එකඟතාව මැනීම සඳහා විවිධ සංස්කෘතික පසුබිම්වලදී භාවිතා කර තිබේ.

[18] සමාජභාවය සම්බන්ධයෙන් පුද්ගල ආකල්ප සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ආකල්ප මැනීම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අධීක්ෂණයේ හා ඇගයීමේ වැදගත් අංගයකි. සමාජ සම්මතයන් අවබෝධ කරගැනීම සඳහා ප්‍රජාවේ වෙනත් අයගේ ආකල්ප සම්බන්ධ දැක්ම ඇතැම් මැදිහත්වීම් ප්‍රයෝජනවත් විය හැකිය. මෙය ක්‍රම ගණනාවකින් කර තිබේ. උදාහරණයක් ලෙස, What Works to Prevent Violence Against Women and Girls Global Programme, GEM Scale වෙතින් ලබාගන්නා ලද අධ්‍යයන හෝ Gender Equity Scale වැනි අධ්‍යයනවලින් ලබාගෙන ප්‍රජාව සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් සිතන ආකාරය මැනීම සඳහා අනුරූප කරගන්නා ලද ප්‍රශ්න සැලකිය හැකිය. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මැදිහත්වීම් විශේෂයෙන් සමාජ සම්මතයන් වෙනස් කිරීම අරමුණු කරන්නේ නම්, ප්‍රජාවේ දැක්ම පිළිබඳ පුද්ගල ආකල්ප සහ දැක්ම පිළිබඳ වඩාත් පරිපූර්ණ දත්ත ලබාගැනීම අවශ්‍ය වේ. සමාජ සම්මතයන් හා වාරණයන් හෝ සමාජ සම්මතයන් ප්‍රතික්ෂේප කිරීම හෝ පිළිගැනීම සම්බන්ධයෙන් වැදගත් යොමු කණ්ඩායම්වල දත්ත එයට අයත් වේ. ලබාගත හැකි විවිධ සමාජ සම්මතයන් මැනීමේ මෙවලම් සම්බන්ධ මාර්ගෝපදේශ සඳහා බලන්න: Samman, E. (2019) Quantitative measurement of gendered social norms. Advancing Learning and Innovation on Gender Norms (ALIGN).

[19] උදාහරණ සඳහා බලන්න: Stern, E., Heise, L. & McLean, L. (2018) The doing and undoing of male household decision-making and economic authority in Rwanda and its implications for gender transformative programming. Culture, Health and Sexuality 20(19); Ellsberg, M. & Heise, L. (2005) Researching Violence Against Women: A Practical Guide for Researchers and Activists. World Health Organization, PATH.

[20] https://www.who.int/immunization/hpv/deliver/nine_steps_for_developing_a_scalingup_strategy_who_2010.pdf

# අධීක්ෂණය සහ ඇගයීම

[21] Goldmann, L., Lundgren, R., Welbourn, A. et al. (2019) On the CUSP: the politics and prospects of scaling social norms change programming. Sexual and Reproductive Health Matters, 27(2): 51-63.

[22] විශේෂ වර්ගවල ජනගහනයන් හෝ සහභාගිකයන් සමග සමීක්ෂණ සහ අධීක්ෂණ හා ඇගයුම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූලධර්ම අට විසින් සලකුණු කරන ලද ඒවාට අතිරේක ආචාරධාර්මික හ ආරක්ෂක අභියෝගයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම අවශ්‍යය. උදාහරණයක් ලෙස, ප්‍රචණ්ඩත්වයේ වැරදිකරුවන් සමග සමීක්ෂණ සිදුකිරීමේදී ඔවුන් ගැහැණුන් වුවත්, පිරිමින් වුවත්, විශේෂිත අවදානම් මතුකරයි. ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීමට සූදානම්ව සිටිය යුතුය. උදාහරණ සඳහා බලන්න: Jewkes, R., Dartnall, E. & Sikweyiya, Y. (2012). Ethical and Safety Recommendations for Research on the Perpetration of Sexual Violence. Sexual Violence Research Initiative. Pretoria, South Africa, Medical Research Council.

[23] WHO (2001) Putting Women First: Ethical and Safety Recommendations for Research on Domestic Violence Against Women. Geneva: World Health Organization; WHO (2016) Ethical and safety recommendations for intervention research on violence against women. Building on lessons from the WHO publication Putting women first: ethical and safety recommendations for research on domestic violence against women. Geneva: World Health Organization.

[24] මෙම මාර්ගෝපදේශය ප්‍රධාන වශයෙන්ම පදනම් වන්නේ, UNICEF (2018) INSPIRE Indicator Guidance and Results Framework ලේඛනය මතය. ළමයින් සමග සමීක්ෂණ සහ අධීක්ෂණය හා ඇගයීම මෙහෙයවීමේදී ආචාරධර්ම හා ආරක්ෂාව සම්බන්ධ පරිච්ඡේදයක් එයට අයත් වේ.

[25] මෙම කරුණ සම්බන්ධයෙන් සම්මුතියක් නැත. ඇතැම් ළමා අයිතිවාසිකම් උද්දේශකයන් තර්ක කරන පරිදි මව්පිය කැමැත්තෙන් තොරව සමීක්ෂණයට සහභාගී වන්නේදැයි තීරණය කිරීමේ අයිතිය ළමයාට ලබාදිය යුතුය. ආරක්ෂිතව කළ හැකි නම් පමණක් ළමයා මව්පිය කැමැත්තෙන් තොරව සම්මුඛ සාකච්ඡාවට සම්බන්ධ කරගත හැකිද යන්න සමීක්ෂකයන් හා වැඩසටහන් කාර්ය මණ්ඩලය තීරණය කළ යුතුය. උදාහරණයක් ලෙස, ළමා විවාහවලදී, ළමා ලිංගික ශ්‍රමිකයන් හෝ පවුලෙන් වෙන්වූ/ වීදි වැනි ළමයින් සඳහා එසේ කිරීමට සිදුවේ. එවැනි අය සමීක්ෂණයට සහභාගී වන බව මව්පියන් දැනගැනීම මගින් අපයෝජන අවදානම වැඩිවිය හැකිය.

[26] Gibbs, A., Dunkle, K. & Jewkes, R. (2018) Emotional and economic intimate partner violence as key drivers of depression and suicidal ideation: A cross-sectional study among young women in informal settlements in South Africa. PLOS ONE, https://doi.org/10.1371/journal.pone.0194885.

[27] Jewkes, R., Nduna, M., Levin J., Jama, N., Dunkle, K., Khuzwayo, N. et al. (2006) A cluster randomized-controlled trial to determine the effectiveness of Stepping Stones in preventing HIV infections and promoting safer sexual behaviour amongst youth in the rural Eastern Cape, South Africa: trial design, methods and baseline findings. Trop Med Int Health. 2006;11 (1):3–16.

[28] Donald, A., Koolwal, G., Annan, J., Falb, K. & Goldstein, M. (2020) Measuring women's agency. Feminist Economics, https://doi.org/10.1080/13545701.2019.1683757.

**© UN Women 2020**

මෙම ලේඛනය **RESPECT ව්‍යුහයේ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශයේ** කොටසකි. එය එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ අනුග්‍රහය මත Social Development Direct විසින් සංවර්ධනය කරන ලදී. එය මෙතැනින් ලබාගත හැකිය.

**Suggested citation:** UN Women and Social Development Direct (2020) RESPECT Framework Monitoring and Evaluation (M&E) Guidance.